# 2014 – 01 – 07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | පී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**(01)**

**01:01** **2013 – 12 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2013 – 12 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 – 12 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**01:02** **2013 – 12 – 10 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2013 – 12 – 10 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 – 12 – 10 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

පසුගිය 2013 -12 - 09 දින අම්බලන්ගොඩ තානායම සම්බන්ධයෙන් වන අදාල ගිවිසුම අත්සන් කරනු ලැබුවා. ඒ සම්බන්ධව විශේෂ නිවේදනයක් ලෙස දැනුම් දෙනවා. ඒ අනුව ලබන නම වෙනිදා සිට එම ගිවිසුම ක්‍රියාත්මක වන බව සභාවට දැනුම් දෙනවා. ගිවිසුම ලියාපදිංචි වූ පසු සභා වාර්තාවට ඇතුල් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි දීර්ඝ කාලයකට පස්සෙ ඔබතුමාගෙ නායකත්වය හා මෙහෙයවීම තුල අපගේ සිහිනයක් සැබෑ වීම සම්බන්ධව කරුණු කාරණා ඉටුවීම සම්බන්ධයෙන් සතුටු වෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමා පුද්ගලිකවම මැදිහත් වෙලා ගත්ත උත්සාහය අම්බලන්ගොඩ නගරයේ ඉදිරි පරම්පරාව වෙනුවෙනුත් රටේ ජාතික ආර්ථිකයට සම්බන්ධ වීමේ යම් මාර්ගයක් හැටියටත් සංචාරක කර්මාන්තය දිනෙන් දින දියුණුවට පත් වෙන මේ අවස්ථාවෙදි එහි තෝතැන්නක් ලෙස සහ රට උත්ප්‍රේරක කාර්යක් ලෙස අම්බලන්ගොඩ නගරයට නූතන මාදිලියෙන් අවශ්‍යවෙලා තිබුණ අම්බලන්ගොඩ තානායම නැවත ප්‍රතිෂ්ඨාපනය වීම සම්බන්ධව ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා විදියට පුද්ගලිකව සමස්ථ අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙනුත් ඔබතුමාට අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා විසින් නීතිමය පැත්තෙන් සභාව සතු දේපල සහ එහි සුරක්ෂිත භාවය සම්බන්ධව ගන්නා ලද තීන්දු වලදී ඔබතුමාගේ නීතිඥ වෘත්තිය උපයෝගී කර ගනිමින් සහ ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් උපයෝගී කර ගනිමින් එය නියමානුකූලව යොදා ගනිමින් කරන ලද සියලු උත්සාහයන් තුල අතරමග නතර වීමට වරින් වර යම් යම් බාධක ආවත් ඒ සියලු දේවල් මගහරවාගෙන ඔබතුමා ගත් මේ උත්සාහය සම්බන්ධව නැවත වරක් මම අම්බලන්ගොඩ ප්‍රදේශවාසීන් වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා.

**(03** **ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

3.1 " සම්මත අතුරු ව්‍යවස්ථා වැලදගැනිම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව " යෝජනා වාරයට ඉදිරිපත් කිරීමට සභාව තිරණය කරන ලදී.

- **පෙ ව 9.45 ට පමණ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

3.2 “ රණවිරු ස්මාරකයක් ස්ථාපිත කරගැනීම සඳහා ” මැයෙන් අම්බලන්ගොඩ රණවිරු සංසදයේ ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කිරීම සඳහා ඔවුන්ගේ දෙමාපියන්, බිරින්දෑවරුන් සහ දූදරුවන් වෙනුවෙන් රණවිරු ස්මාරකයක් සාදාදීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා මහජන ක්‍රීඩා පිටිය අභියස කොටසක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

- **පෙ ව 9.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි රටක් විදියට දෙපයින් සිට ගැනීමට අපට ශක්තිය දුන්න ඒ රණවිරුවන් වෙනුවෙන් අම්බලන්ගොඩ ජනතාව විසින් උපහාරයක් කිරීමට මෙවන් ස්මාරකයක් ඉදි කිරීම සුදුසු යැයි මම පෞද්ගලිකවත් නගරවාසීන් වෙනුවෙන් විශ්වාස කරනවා. රටේ ඉතිහාසය නැවත පුනර්ජීවනය කිරීමටත් ඒතුලින් නැවත නැගී සිටීමටත් අපේ ඉදිරි පරම්පරාවට උරුමකර දීමටත් එවන් සිහිවටනයක් ස්ථාපිත කර දීමේ යෝග්‍යතාවය අපි නැවත නැවතත් සිහිපත් කරනවා. එහිදී අපි භෞතික සැලැස්මක් අනුව පිලිවෙලකට එය ස්ථාපිත කල යුතුයි. උදාහරණයක් විදියට සභාපතිතුමනි පාර්ලිමේන්තුව අභියස තිබෙන රණවිරු ස්මාරකය. ඉදිරියේදී අපේ රණවිරුවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීමට ඉඩකඩ සලස්වමින් අවශ්‍ය වෙලාවට ඒ ලේඛනගත කිරීම් සිදු කිරීමට හැකි වන පරිදි ස්ථාපිත කිරීම සුදුසුයි කියා සිතනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක වාර්තාවෙ තාක්ෂණ නිලධාරි විසින් නිර්දේශ නොකරමි කියල තමයි තියෙන්නෙ. ඉහත කරුණ සඳහා දැනට අම්බලන්ගොඩ රණවිරුවන්ගේ ස්මාරකයක් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති බවත් නගරයට එක් ස්මාරකයක් පමණක් ප්‍රමාණවත් වන බැවින් ක්‍රීඩා භූමියේ තවත් ස්මාරකයක් ඉදි කිරීම නිර්දේශ නොකරමි කියල තමයි තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එය සැබෑවක්. නමුත් සභාවක් හැටියට ජනතා නියෝජනයක් තිබෙන භූමියක ඉදිකිරීම තුලින් ඉදිරි පරම්පරාවේ දුවා දරුවන් නිරන්තරයෙන් ගැවසෙන භූමියක ජනතාවට අපහසුවක් නොවන ආකාරයට අලංකාර අන්දමින් තිබීමට සැළැස්වීම සුදුසුයි කියල මම පෞද්ගලිකව විශ්වාස කරනවා. රට අමතරව සභාවෙ ගරු මන්ත්‍රීවරුන්ගෙ අදහස් මත ඔබතුමාගේ නායකත්වය මත මෙය කිරීමට වෙර දරමුයි කියා විශ්වාස කරමින් මම නිහඬ වෙනවා.

- **පෙ ව 9.55 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා සභාවට පැමිණෙන ලදී.**
- **පෙ ව 9.55 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා සභාවට පැමිණෙන ලදී.**
- **පෙ ව 9.55 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දේශ හිතෛෂී රණශූරින්ගේ සේවාව අනුපමේයයි. ඒනිසා මම හිතන්නෙ කිත්සිරි මන්ත්‍රීතුමාගෙ අදහස් හා යෝජනා අපි අගය කරන අතරම විවිධ නගරයන්ගේ රණශූරයන්ගේ නාමපුවරු සහිත ස්තම්භ ඉදිවෙනවා.

අම්බලන්ගොඩ නගරයේ ඉදිවී තිබෙන්නේ අඩු පහසුකම් සහිත ස්තම්භයක් පමණයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ. මම හිතනවා මෙම සංසදය ඉල්ලා තිබෙන පරිශ්‍රය මම හිතනවා බොහොම නිස්කලංකව ගෞරවාන්විත ලෙස ස්මරණය කල හැකි ස්ථානයක් කියල. අපේ නිලධාරීන් කරුණු නොදැන වෙන්න ඇති එවැනි වාර්තාවක් ඉදිරිපත් කරල තියෙන්නෙ. එනිසා සමස්ථ සභාවේම අවධානය මේ ගැන යොමු කරල අපි නියමිත ගෞරවය ඒ අයට ලබා දෙමුයි කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදී හිතවතුනි, නිලධාරීවරුනි, අපි වසර තිහක පමණ කාලයක සිටම ඉතාමත්ම දුෂ්කරතාවලට මැදිවෙලා මේ රටේ දියුණුව වසර ගණනාවක් පස්සට ගිහිපු යුගයක අපි හිටියෙ. එයින් අපි මුදව ගන්න අපේ අනාගත පරපුරට යහපත් දේශයක් උදාකරල දෙන්න ඒ රණවිරුවන් දේශය වෙනුවෙන් රුධිරය පූජා කරල ත්‍රිවිධ හමුදාවල, පොලිසියේ සහ අවශේෂ හමුදාවන්ගේ සියලුම දෙනාම මහත්වූ කැපවීමක් කරා. එහිදී මේ දේශයේ දරුවන්ට පියවරු අහිමි වූ සංඛ්‍යාව ඉතා විශාලයි. විශේෂයෙන් අපේ ගමේ නගරයේ දිවිපිදූ විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඔවුන්ගේ දරුවන්ට නෑදෑයන්ට ඔවුන් ස්මරණය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල සෑම නගරයකම පාහේ ස්මාරකයන් තියෙනවා. නමුත් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියෙන්නෙ ස්මාරකයක් නොව නාම පුවරුවක් විතරයි. මම එය ස්මාරකයක් විදියට පිලිගන්න කැමති නැහැ. මමත් කාලයක් හමුදාවෙ සේවය කරපු කෙනෙක් හැටියට මම කියන්නෙ ඔවුන්ට නියම ගෞරවය ලබා දීම සඳහා ඔවුන්ගේ දූවා දරුවන්ට අභිමානයෙන් යුතුව එම ස්ථානයට ගිහිල්ල මේ මගේ පියා මේ මගේ සොහොයුරා ඥාතියා කියලා ඔවුන් ස්මරණය කරන දිනයන්හිදී මල් කළඹක් තබල පහනක් පත්තු කරල ඒ ස්මරණයන් කරන්නට සුදුසු ස්ථානයක් අවශ්‍යයි. ඒ අවශ්‍ය ස්ථානය මේ යෝජනා කරපු ස්ථානයමයි කියල මම කියන්නෙ නෑ. නමුත් ඔවුන් නිතර දෙවේලේ සිහි ගැන්වෙන ස්ථානයක් වෙන්න ඕනෙ. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියොත් විතරයි එය දකින්නෙ. මම හිතන්නෙ සෑම නගරයකම පාහේ තියෙන්නෙ ප්‍රධාන නගරයට ආසන්නව. එම නිසා සුදුසු ස්ථානයක් ලබා දීම අපගේ යුතුකමක්. දේශය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට කරන ගෞරවයක්. එයට මේ සභාවෙ කිසිම මන්ත්‍රීවරයෙක් විරුද්ධවෙන එකක් නැහැ සුදුසු ස්ථානයක එය ස්ථානගත කරනවට. එම නිසා ඔබතුමා මේ ගැන අවධානය යොමු කරල දේශය වෙනුවෙන් දිවිපිදූ ඒ රණවිරුවන් ස්මරණය කිරීම සඳහා සුදුසු ස්ථානයක් ඉදිකිරීමට දායක වීඹ අපි සැමගේම යුතුකමක්. එය මේ දේශයේ නිවහල්ව සිටින අපට ඔවුන් වෙනුවෙන් කරන්න පුලුවන් ලොකුම ගෞරවයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදී මහතුනි, උදෑසනම රණවිරුවන් සම්බන්ධයෙන් කතා කරන්න ලැබුනෙ. ජාතියේ මුර දේවතාවන් වශයෙන් චිරාත් කාලයක් මේ රට අරාජික යුගයක පවතිද්දි අතිගරු ජනාධිපතිතුමානන්ගේ මග පෙන්වීම යටතේ මේ රටත් ජාතියත් මෑතකදී එක්සේසත් කරනු ලැබුවා. මෙහිදී දිවිපිදූ ශ්‍රේෂ්ඨ රණවිරුවන් වෙනුවෙන් ඔවුන් ස්මරණය කිරීම සඳහා ස්මාරකයක් ඉදි කිරීම කෘතගුණදත් ජනතායක් විදියට අපි කාගේත් යුතුකමක් වෙනවා. අපි කොතැනක ගියත් ඒ රණවිරුවන් වෙනුවෙන් ස්මාරකයක් ඉදිවෙලා තියෙනවා. ඒ දෙය අම්බලන්ගොඩ නගරය තුලත් ඉදි වීම පිළිබඳව අපි කටයුතු කල යුතුයි. රණවිරු සංසදය ඒ සඳහා මූලික වෙනවනම් ඒ සඳහා අපි මහජන නියෝජිතයන් වශයෙන් අවසර ලබා දිය යුතුයි. ඒ රට බේරාගත් රණවිරුවන් වෙනුවෙන් අපට වෙන කල හැකි දෙයක් නැහැ. මෙවැනි දෙයක් සඳහා ස්ථානයක් තෝරා ගැනීමේදී කල්පනාකාරී විය යුතු වෙනවා. නගර සභා ක්‍රීඩා පිටිය තුල ප්‍රභුවරුන්ගේ අවමගුල් ආදාහන කරනකොට විශාල ප්‍රශ්නයක් ඇති වුනා. එහිදී අපි තීරණය කරා මේ ක්‍රීඩා පිටිය සොහොන් සඳහා ලබා දෙන්නෑ කියල. මන්ත්‍රීවරුන් කියූ ආකාරයට මේ රණවිරුවන් ස්මරණය කරන දිනකදී මල් කළඹක් තබන්න පහනක් පත්තු කරන්න වෙනවා. නමුත් මෙතන ක්‍රීඩා පියිටක්. එනිසා මම විශ්වාස කරන්නෙ නෑ මේ ක්‍රීඩා භූමියේ කොතැනක හෝ මෙය ස්ථාපිත කිරීම යෝග්‍යයි කියලා. මම හිතනවා මෙයට සුදුසු ස්ථානය අප සතු ඔරලෝසු කණුව ඉදිරිපිට ඇති ත්‍රිවිල් පාර්ක එක කියලා. ඒ භූමිය තුල ස්ථාපිත කරන එක තමයි සුදුසු කියල මගේ හැගීම. මගේ පුද්ගලික මතය ක්‍රීඩා පිට්ටනිය අසල සුදුසු ස්ථානය නොවන බවයි. එතනදි යම් යම් ප්‍රශ්න ඇති වෙන්න පුලුවන්. ගරු සභාවෙ මතයට මමත් ගරු කරනවා. මම යෝජනා කරපු ස්ථානය හෝ ඊටත් වඩා සුදුසු ස්ථානයක් ඔබතුමන්ලා විශ්වාස කරනවා නම් හෝ සුදුසු

ස්ථානයක මෙම ස්මාරකය ඉදිකරන මෙන් ඉල්ලා සිටිනවා. දේශය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මම සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු සියලු සහෝදර මන්ත්‍රීවරුන්ටත් නිලධාරීන් ඇතුලු මාධ්‍යවේදීන් සියලු දෙනාටත් සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. මේ සාකච්ඡා කරන කාරණය අපෙන් මග හැරුන කාරණයක්. අද බොහෝ නගර වල රණවිරුවන් වෙනුවෙන් ස්මාරක ඉදි කරල තියෙනවා. ඒවගේම අපි දන්නව ජයවර්ධනපුර පාර්ලිමේන්තු සංකීර්ණය අසල ස්මාරකයක් තියෙනවා. ඒ රටට දැයට වැඩ කරපු අය වෙනුවෙන්. අපේ රටේ දශක තුනක පමණ කාලයක් තිබුන මේ යුද්ධයෙන් අපි සැහෙන දුක් වින්දා. එහිදී අම්මාවරුන්ට දරුවන් නැති වුනා. බිරින්දෑවරුන්ට ස්වාමිපුරුෂයා නැති වුනා. දූ දරුවන්ට තම පියාණන් නැතිවෙලා තියෙනවා. ඒවගේම විශාල ප්‍රමාණයක් අත්පා අහිමිවෙලා දෑස් අහිමි වෙලා රණවිරුවන් විශාල ප්‍රමාණයක් දුක් විඳිනවා. අපි මේ රට බොරාගත් රණවිරුවන් ගැන දැඩි අවධානයක් යොමු කරන්න ඕනෙ. මෙම සංසදය විසින් කරනු ලැබූ මෙම ඉල්ලීම සාධාරණ ඉල්ලීමක්. පොල්වත්ත පිට්ටනිය අසල තමයි ශ්‍රී බුද්ධදත්ත නාහිමියන්ගේ පිළිරුව හදල තියෙන්නෙ. අද වෙනතුරු එයට හානියක් වෙලා නැහැ. එනිසා මම හිතන්නෙ මේ රණවිරුවන් වෙනුවෙන් ක්‍රීඩා පිටිය අසල ස්ථානයක් හඳුනා ගන්න පුලුවන්. මේ සඳහා කැපවෙලා කටයුතු කිරීම අපේ යුතුකමක්. යුද්ධය වෙනුවෙන් දිවිපිදූ විශාල පිරිසක් අම්බලන්ගොඩ නගරය තුල ඉන්නවා. අපි ඒ අය වෙනුවෙන් මෙම ඉල්ලීම ඉෂ්ඨ කිරීම සාධාරණ යැයි ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාටම සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම ප්‍රකාශ කල පරිදි වසර තිහක් තිබුන යුද්ධය නිම කරල රටේ ජනතාව අද නිදහසේ ජීවත් වෙන්නෙ මේ රණවිරුවන් හින්දා. අපි දන්නවා අම්බලන්ගොඩ රණවිරුවන් විශාල ප්‍රමාණයක් නැති වුනා. මට මතකයි අම්බලන්ගොඩ ප්‍රදේශයේ මුලින්ම රණවිරුවකු වශයෙන් ජීවිතය පූජා කලේ මගේ බාප්පා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියෙන ලේඛණයේ ඒ රණවිරුවගෙ නම නැහැ. මේ රණවිරු සංසදයේ වැඩි ප්‍රමාණයක් ඉන්නෙ ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගෙ බිරුන්දෑවරුන්. මේ අයට මෙම කටයුත්ත කර ගැනීම මම හිතන්නෙ අපහසුයි. අම්බලන්ගොඩ නගරයේ ස්මාරකයක් ඉදිකිරීම සම්බන්ධව මම එකගතාවය පල කරනවා. ඒ සඳහා මම දකින හොදම ස්ථානය තමයි ඌරවත්ත පාලමට මෙහායින් තියෙන බිම් තීරුව. ජනතාවට නිතර පෙනෙන තැනක්. නගරයටත් කිසිම හානියක් වෙන්නෙ නැහැ. මගේ පුද්ගලික අදහස ඒක. මමත් එකගයි මන්ත්‍රීවරුන්ගෙ කැමැත්ත අනුව යම් ස්ථානයක් මේ සඳහා ලබා දීම සම්බන්ධව. ඒවගේම අපි අමතක කරන්න හොඳ නෑ අපේ ආරක්ෂක ලේකම්තුමා ආබාධිත රණවිරුවන් වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරනවා. මේ රට වෙනුවෙන් ආබාධිත වෙච්ච රණවිරුවන්ට කවදාකවත් අපේ රජය අතිගරු ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා අපි කවදාවත් ඒ රණවිරුවන් අමතක කරල නැහැ. ඒනිසා රණවිරු ස්මාරකය ඉදිරිපත් කරන්නට අම්බලන්ගොඩ නගර සභාවෙන් ස්ථානයක් ලබා දිය යුතුයි. ඒ නිසා සභාපතිතුමනි එයට අවශ්‍ය මූලික අඩිතාලම ඔබතුමා විසින් සකස් කරල මේ කටයුත්ත ඉටු කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි රණවිරු සංසදය මගින් ඉදිරිපත් කරපු යෝජනාව ප්‍රශංසනියයි. මෙම ස්මාරකය ඉදිකිරීම සඳහා යෝජනාව ගෙන ඒම සම්බන්ධව මම ඒ අයට ස්තුතිවන්ත වෙනවා. තිස් අවුරුදු යුද්ධය නිමා කරන්න මූලිකත්වය දුන්නෙ ජෙනරල් සරත් ෆොන්සේකා මහතා කියල මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ඒවගේම ආබාධිත වූ සහ දිවිපිදූ සියලුම රණවිරුවන් වෙනුවෙන් මම මේ අවස්ථාවේදී එතුමන්ලාගේ පවුල් වල අය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා.

ඒවගේම මෙම ස්මාරකය ඉදි කිරීම සඳහා සුදුසු ස්ථානයක් කමල් මන්ත්‍රීතුමා කියූ ආකාරයට කාටවත් කරදරයක් නැති විදියට එය අම්බලන්ගොඩ නගරය ආරම්භ වන ස්ථානයේ ස්ථාපිත කිරීම සුදුසු යැයි මම විශ්වාස කරනවා. සභාපතිතුමාගේත් මන්ත්‍රීවරුන්ගේත් අදහස අනුව එය සාදා නිම කිරීමට කටයුතු කරන්නයි කියල ඉල්ලීම් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි රණවිරු සංසදය මගින් ස්මාරකයක් ඉදි කිරීමට ඉල්ලීමක් කරල එවන ලද ලිපිය ඉතා වැදගත්. මොකද මේ රණවිරුවන් නිසා තමයි අද අපි බය නැතුව ජීවත් වෙන්නෙ. තමන්ගේ පවුලේ කෙනෙක් කොළඹ හරි දුර පළාතකට හරි ගියොත් ගෙදර එනකන් අපි බයෙන් හිටියෙ. උදාහරණයක් විදියට කොළඹ ඉඳල මාතර යන බස් රථයක් කහව ප්‍රදේශයේදී බෝම්බ ප්‍රහාරයකට ලක් වුනා. බසයේ සිටි බොහෝ දෙනා ජීවිතක්ෂයට පත්වුනා. සමහරුන්ට අත පැය නැති වුනා. ඇස් අන්ධ වුනා.  අපිට ලොකු දුකක් ඇත්තටම එහිදී ඇති වුනා. ඒවගේම ආබාධිත රණවිරුවන් දැනටත් තම දුවා දරුවන් සමග ජීවත් වෙනවා. රණවිරුවන් ගේ නොයෙක් වැඩ සටහන් රූපවාහිනිය තුලින් අපි දකිනවා. ඒ සඳහාත් ආබාධිත රණවිරුවන් ඉදිරිපත් වන අවස්ථා වලදී අපිට විශාල කණගාටුවක් ඇති වෙනවා. මේ රට බේරාගත් ඔවුන්ට අපි ගරු කල යුතුයි. මම හිතන්නෙ අම්බලන්ගොඩ තමයි රණවිරුවන් උදෙසා ස්මාරකයක් නැත්තෙ. මෙම සාධාරණ ඉල්ලීමට සභාපතිතුමනි අපි ඔවුන්ට සහයෝගය ලබා දෙමු. මම කැමතියි ක්‍රීඩා පිටිය අසල ලබා දෙනවට වඩා හිරේවත්තෙ බුදු පිළිමය අසලින් යම් ස්ථානයක් ලබා දෙනවනම්. ගරු මන්ත්‍රීවරුන්ගෙත් කැමැත්ත විමසල සුදුසු ස්ථානයක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, විපක්ෂනායකතුමා, උප සභාපතිමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ට 2014 නව වර්ෂයට සුබ ප්‍රාර්ථනා කරන අතර සියලුම සේවක සේවිකාවන්ට සුබ ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි පසුගිය දිනෙක මෙම ස්ථානයටම පැමිණියා රණවිරු බිරිඳක්. එම තැනැත්තිය විසින් තනියෙන් ස්මාරකයක් හදන්න කරුණු කියා පෑව. ඒ අවස්ථාවෙදිත් අපි පොදුවේ ස්මාරකයක් හදන මතයෙ හිටියා. මම හිතනවා සභාපතිතුමා ඒකට දැන් අවස්ථාව ඇවිල්ලා තියෙනවා මේ ඉල්ලීමත් එක්ක. අවුරුදු තිහක පමණ කාලයක් තිබුන යුද්ධය අවසන් කරපු රණ විරුවන් වෙනුවෙන් මගේ ගෞරවනීය ආචාරය මේ අවස්ථාවෙ පුද කරනවා. මම හිතනව සභාපතිතුමි අපේ උප සභාපතිතුමා කියූ ආකාරයට බුදු පිළමයට මෙහායින් ගාලු පාර අයිනේ මෙය තිබුන නම් ඇත්තටම හොඳයි. රණවිරුවකුගේ භාර්යාවකට දරුවෙකුට ඕනෑම වෙලාවකට ගිහිල්ල ස්මරණය කරන්න පුලුවන්. පිට්ටනිය අසල මෙය ඉදිකරන එක එතරම් සුදුසු නෑ කියන එක තමයි මගේ මතය. ඔරලෝසු කණුව ඉදිරිපිටත් වානිජ වටිනාකමක් තියෙන තැනක්. එනිසා මම උප සභාපතිතුමා සඳහන් කල ස්ථානයට එකගතාවය පල කරමින් නිහඬ වෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් සියලු දෙනාම එකගතාවය පලකරනවා. ප්‍රශ්නෙකට තියෙන්නෙ ස්ථානය තෝරා ගැනීම සම්බන්ධවයි. ස්ථානයක් විදියට බුදු පිළිමයට පිටුපසින් ස්ථානයක් තියෙනව ඉතුරු වෙලා. ලංකා ටයිල් එකට යාබදව තිබෙන ස්ථානය සම්පූර්ණම නිදහස්. රේල්පාරෙ ඩබල් ලයින් ගියොත් එතනදි ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා බුදු පිළිමයට පිටුපසින් තිබෙන ස්ථානය තිරණය කරමු. රණවිරු ස්මාරකයක් සෑදීම සඳහා කැමති කෙනෙක් සැලැස්මක් ඉදිරිපත් කරන්න කියල පත්තරේ පොඩි දැන්වීමක් දාමු.

**<u>තීරණය</u>**

☞ **රණවිරු ස්මාරකයක් හිරේවත්ත බුදු පිළිමයට නුදුරින් ඇති හිස් බිම් කොටසෙහි ඉදිකිරීම සුදුසු බවටත් ඒ සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අයෙකු සැළැස්මක් ඉදිරිපත් කරන ලෙස දන්වා පුවත්පත් දැන්වීමක් පල කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**(04)** **යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ** නැත

**(05)** **යථා පරිදි කල්දී ඇති යෝජනා**

**5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**5:1:1** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 ඔක්තෝම්බර් මස 25 වැනි දින අංක 1834 දරණ ගැසට් පත්‍රයේ, ගරු දකුණු පළාත් මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශිය වෛද්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය පී. ඩබ්. ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා විසින් 2013 සැප්තැම්බර් මස 26 වැනි දිනෙන් අනුමත කර ඇති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව අම්බලන්ගොඩ නගර සභාව විසින් වැලදගත යුතු යැයි යෝජනා කර සිටිමි.

**ඉහත සඳහන් යෝජනාව පිළිගත යුතු බවටත් අම්බලන්ගොඩ නගර සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීම සඳහා ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**5:1:2** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 ඔක්තෝම්බර් මස 25 වැනි දින අංක 1834 දරණ ගැසට් පත්‍රයේ, ගරු දකුණු පළාත් මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශිය වෛද්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය පී. ඩබ්. ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා විසින් 2013 සැප්තැම්බර් මස 26 වැනි දිනෙන් අනුමත කර ඇති මදුරුවන් සහ රෝග බාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව අම්බලන්ගොඩ නගර සභාව විසින් වැලදගත යුතු යැයි යෝජනා කර සිටිමි.

**ඉහත සඳහන් යෝජනාව පිළිගත යුතු බවටත් අම්බලන්ගොඩ නගර සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීම සඳහා ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා : නැත**

**(06)** **කාරක සභා වාර්තා සලකා බැලීම**

**6: 1** **2013- 11- 22** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**
**කළමනාකරණ කමිටු වාර්තාව**

දිනය : 2013 11 22
ස්ථානය : නගර සභාව අම්බලන්ගොඩ
වේලාව : ප ව 2 300
සහභාගීත්වය :

ඇම්. ඩබ්. අරුණ ප්‍රදිප් - සභාපතී
භාරත සමරසේකර - ලේකම්
ඞී ඩබ් පද්මසිරි - ගණකාධිකාරී
සිසිර කුමාර - කර්මාන්ත අධිකාරී
ශාන්ති ඩී රාමනායක - ප්‍රධාන කළමනාකරණ සහකාර
එස් නිර්මලා ද සිල්වා - ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම්

පී එස් එස් ද සිල්වා - මහජන සෞඛ්‍ය පරීක්ෂක
ඩබ් පී සිල්වා - ප්‍රජා සංවර්ධන නිළධාරි
කේ සී සී ප්‍රනාන්දු - අභ්‍යන්තර විගණන නිළධාරි
පී එම් ටී විමලධර්ම - සංවර්ධන නිළධාරි

01 පිළිගැනීම :

➢ ලේකම්තුමා විසින් කළමනාකරණ කමිටු සමාජිකයින් පිළිගන්නා ලදී

**අයතන අංශය පිළිබද සාකච්චා කිරීම**

➢ කර්‍ය සාධක ලකුණු මට්ටම් පෞද්ගලික ලිපිගොනුවලට ඇතුලත් කර යුතුය. ලබා ඇති ලකුණු මට්ටම් මදි බවත් එම ලකුණු මට්ටම් වැඩි කර ගනිමින් දකුණු පළාතේ වැඩිම ලකුණු ලබා ගන්නා ආයතනය බවට පත් කිරීමට සියලු දෙනාම කටයුතු කලයුතුය.

➢ කාර්ය සාධක ලකුණු මට්ටම් ලබා නොගන්නා පුද්ගලයින්ගේ වැටුප් වර්ධක අත්සන් නොකරන්න.

- ගරු සභාපති

➢ වරිපනම් පරිගනක ගත කරන බවත් සියලුම ලිපි යාවත්කාලීන කරන බවත් ප්‍රකාශ කරන ලදී.

- ගණකාධිකාරී

➢ මේ සති අන්තයේ හෝ සියලුම රාජකාරී අවසන් කරන ලෙස ඉල්ලා සිටි අතර ඔවුන් සදහා අතිකාරම් දීමනා ලබා දීමට කටයුතු කරන ලෙසත් ඒ සදහා අනුමැතිය ලබා දෙන ලෙස ලේකම්තුමාගෙන් ඉල්ලි සිටින ලදී.
- ගරු සභාපති

➢ රාජ්‍ය අංශයේ සියලුම වත්කම් හෙළි කරන ලෙස රාජ්‍ය අංශය ඉල්ලා සිටි අතර දැනට ඉඩම් හා ගොඩනැගිලි පිළිබදව ගිණුම් තක්සේරු වටිනාකම් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

- ගණකාධිකාරී

➢ මෙම ඉඩම් ගොඩනැගිලි සදහා තාවකාලිකව තක්සේරුවක් ලබා දීමට කටයුතු කරන ලෙසත් අප සතුව පවතින ඉඩම් හිමිකර ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපති

➢ අපහරණය කරන ලද වාහන සභාවට දමා අනුමැතිය ලබා ගත යුතුබව ඉන්ජිනේරු මහතා ප්‍රකාශ කල බවත් වර්තමානයේ වාහන 17 ක් ඇති බවත් එම වාහන එක් පුද්ගලයෙකුට නඩත්තු කල නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී

- කර්මාන්ත අධිකාරී

➢ වාහන ඉවත් කරන්නේ නම් ඒ සදහා කමිටුවක් පත් කල යුතුය.

- අභ්‍යන්තර විගණන නිළධාරි

➢ පරණ පුටු තොගයක් තිබෙන බවත් ඒවා ඉවත් කරන ලෙසත් ඉල්ලීය.

-ප්‍රධාන කළමනාකරණ සහකාර

**සෞඛ්‍යය අංශය**

➢ ට්‍රැක්ටර පිළිබදව ප්‍රශ්නයක් ඇති බවත් අධීක්ෂවරු 4 දෙනෙකු සිටින නමුත් ඔවුන් තම රාජකාරී මග හරන බවත් ප්‍රකාශ කරන ලදී.

-මහජන සෞඛ්‍ය පරීක්ෂක

➢ ඔවුන්ට වෙන වෙනම රජකාරී පවරා දි ඒ පිළිබදව වගකිම පවරන බව ප්‍රකාශ කරන ලදී.

- ලේකම්

➢ කම්කරුමහතුන් චිරාත් කාලයක් තිස්සේ පවත්වාගෙන එන ක්‍රියාකාරකම් තමාට එකවර නතර කර නොහැකි බවත් නමුත් මෙම තත්වය මගහරවා යාවත්කාලින කිරීමට කටයුතු කරන බවත් ඉට කාලය අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි

-මහජන සෞඛ්‍ය පරීක්ෂක

➢ කම්කරුවන් 2ක්ගේ ඇඟිලි සළකුණ සටහන් නොවන බව ප්‍රකාශ කරන ලදී.

- අභ්‍යන්තර විගණන නිළධාරි

➢ ටැක්ටර වලට ඩිසල් ගැසීමේදි ක්‍රමවත් වැඩ පිළිවලක් වර්තමානයේ කොමැති බවත් මීට පෙර ක්‍රියාත්මකවූ වැඩපිළිවලම නැවත ආරම්බ කරන ලෙස ඉල්ලිය.

- කර්මාන්ත අධිකාරී

➢ එය අනුමත කරන ලදී.

- ලේකම්

**ගිණුම් අංශය**

➢ වැටුප් ලබාදෙන දවසට කම්කරුමහතුන් හදුනන්නේ නැති නිසා ජාතික හැදුනුම් පත හෝ මෙම ආයතනයෙන් ලබා දෙන හැදුනුම්පත හෝ රැගෙන එන ලෙෂ දැනුවත් කරන්න.

- ගණකාධිකාරී

➢ ඔවුන්ව දැනුවත් කරන ලෙස ඉල්ලන ලදි

- ලේකම්

➢ දෛනික වැටුප් ලාබින්ගේ මෙම මාසයෙ සිට රාජ්‍ය සේවා අර්ථසාදක අරමුදලට වැටුප් යැවීමට තිරනය කර ඇත අවුරුදු 60 වැඩි පුද්ගලයින් සදහා පරණ ක්‍රමයට අනුව සේවක අර්ථසාදක අරමුදලට වැටුප් යැවීමට යෝජනා කර ඇත

➢ ධැනට අපට විශාල ණයක් ගෙවීමට සිදුවී තිබේ අපෙ සමාන්‍ය ආදායම රු 2500000 – 3000000 අතර වේ

- ගණකාධිකාරී

➢ විශාල වශයෙන් වරිපනම් නොගෙවු මුදලක් ඇත එම මුදල රු 10000000 ට ආසන්නව පවතින බවත් තක්සෙරු කරන ලද සමහරක් ඉඩම් සොයාගත නොහැකිව පවතින බවත් දේපල තහනම් කිරීමට තමාට බලයක් නොමැත ඒ සදහ ආදායම් පරිපාලකට බලය ඇති බව ප්‍රකාශ කරන ලදී.

- ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම්

➢ ආදායම් පරිපාලකව දැනුවත් කරන ලෙසට යෝජනා විය

➢ වාහන වලට ඩීසල් සදහා යන වියදම රු 300000 කට අධික වන බව ප්‍රකාශ කරන ලදී.

- ගණකාධිකාරී

➢ වර්ථමානයෙ ඩීසල් මිල අධික බවත් වාහන පරන වනවිට ඒ සදහ යන ඩීසල් ප්‍රමාණයත් අධික වීම සාමන්‍ය දෙයක් බවත් ප්‍රකාශ කරන - ලේකම්

➢ උවුරුදු 60 වැඩි පුද්ගලයිත් කිහිපදෙනෙක් සේවයේ යෙදී සිටිත බවත් ඔවුන් පිළිබඳ වගකීමක් දැරීමට සිදුයක ඉවත් එය අවදාතම් බැවිත් ඔවුන් පිළිබදව තීරණයක් ගැනීමට යෝජනාවේ

➢ ආදායම් එකත කරණ පුද්ගලයාගේ රාජකාරිය කුමක් - ගණකාධිකාරී

➢ ඔහු රාජකාරී වේලාවෙහි කාර්යයක් දෙකක නිරතව ආදායම් දෙකක් ලබන බවත් ඔහුගේ රාජකාරිය පිළිබදව නිසි පියවරක් ලබාගත යුතු බව යොජනා විය - කමිටුවෙ සියලුම සාමාජිකයින්

➢ එම පුද්ගලයා මගින් යම් ආදායමක් ආයතනයට ලැබෙන බව ප්‍රකාශ කරන ලදී

-ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම්

**ප්‍රජා අංශය**

➢ පොත් බෙදා දීමේ උත්සවය ලබන මාසයේ පැවැත්වීමට සුදානම් කර ඇති බව ප්‍රකාශ කරන ලද

- ප්‍රජා සංවර්ධන නිළධාරී

➢ පොදු වැසිකිළියක් ක්‍රීඩා භූමිය තුල ඉදිකිරීම ඉල්ලා අවසර පත්‍රයක් ලැබුණු බවත් එය තමන් ප්‍රතික්ෂේප කළ බවත් ප්‍රකාශ කරන ලදී - කමිටුවෙ සියලුම සාමාජිකයින්

➢ අප ආයතනය මිලදී ගන්නා ලද පරිගණක ගුණාත්මක තත්වයෙන් නොමැති බවත් එසේ සිදු නොවන ලෙසට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී - කර්මාන්ත අධිකාරී

➢ පරිගණක වැනි තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී තාන්ෂණික කමිටුවක ඇගයීමකට ලක් කර එම කමිටුව මගින්බ නිර්දේශ කරන ලද පර්ගණක පමණක් මිලදී ගන්නා ලෙස යෝජනා කරන ලදී

- කමිටුවෙ සියලුම සාමාජිකයින්

02 රැස්වීම් කටයුතු අවසන් කිරීම

**ඒ අනුව 2013 -11- 22 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 12- 12** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>2012-12-12 දින පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු රැස්වීම් වාර්තාව</u>

**දිනය** :- 2012-12-12

**ස්ථානය** :- **නගර සභාව -අම්බලන්ගොඩ**

**වේලාව** :- ප. ව. 2.30

**සහභාගීත්වය** :-

| | | |
|---|---|---|
| 1 | නීතඥ එම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා | - ගරු සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ |
| 2 | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 3 | එච්.එච්.ජයසේන මහතා | - මහජන සෞඛ්‍ය පරීක්ෂක ,නගර සභාව,අම්බලන්ගොඩ |
| 4 | පී.එස්.එස්. ද සිල්වා මහතා | - මහජන සෞඛ්‍ය පරීක්‍ෂක අම්බලන්ගොඩ |
| 5 | කේ. ශාන්ති මහත්මිය | - ගොවිජන සංවර්ධනනිලධාරී- අම්බලන්ගොඩ |
| 6 | එච්.එච්.ඒ. ද සිල්වා මහතා | - ග්‍රාම නිලධාරී, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 7 | ඩී.වී. තරංගි මහත්මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| 8 | බී.ඩී.ඊ. කොඩිතුවක්කු මහත්මිය | - පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී |
| 9 | පී.එච්.එල්.සී. පුෂ්පරාණි මහත්මිය | - සංවර්ධන සහකාර |
| 10 | එම්.ඩබ්. හිරාන් සංජීව | - සෞඛ්‍ය පරිපාලක |
| 11 | ඒ.ඒ.කේ. රණවික්‍රම | - සෞඛ්‍ය පරිපාලක |

**පිළිගැනීම :- ගරු සභාපති එම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

අද දින රැස්වීම සඳහා පැමිණි වෛද්‍යතුමිය ඇතුලු එම කාර්ය මණ්ඩලයත් නගර සභා මන්ත්‍රී දෙපලත් ග්‍රාම නිළධාරී මහතුන් ගොවිජන නිළධාරීතුමියත් ලේකම් මහතා ඇතුලු කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි

ඉන් අනතුරුව 2012-10-30 දින රැස්වීමේ සාකච්ජා වු කරුණු සමාලෝචනයක යෙදෙමින් සභාව ඉදිරියට මෙහෙය වීය

ඒ අනුව බස්නැවතුම්පල වැසිකිළිය උතුරායාම පිළිබඳව මගසෞගපග ජයසේන මහතා කියා සිටියේ එම වැසිකිලිවල සඳහා තාවකාලික විසදුමක් වශයෙන් කොන්ක්‍රීට් තට්ටුවක් දමා කාන්දුවීම නවතා ඇති බවයිග රුහුණු විශ්ව විද්‍යාලයේ අදාල නිළධාරීන් හමුවී සාකච්ජා කල අවස්ථාවේ ඔවුන් ස්ථාන පරික්‍ෂාවක් සිදුකිරීමට පැමිණෙන බව පවසා තිබුන ද ඔවුන් නොපැමිණි නිසා දුරකතන ඇමතුමක් මගින් සම්බන්ධකර ගැනීමට උත්සාහ ගත්ත ද එය ද අසාර්ථක වියග එම නිළධාරීන් ජපානයට ගොස් ඇති බව දැනගන්නට ලැබුන බව ප්‍රකාශ කරන ලදි

පවුල් සෞඛ්‍ය සායනයට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ඇති බැවින් ඒ පිළිබඳ සාකච්ඡා නොවියග දරුවන්ගේ බර කිරීම සඳහා බර කිරණ තරාදියක් (Bathroom Scale- ලබාදෙන ලෙස පවුල් සෞඛ්‍ය සේවිකා කොඩිතුවක්කු මිය ප්‍රකාශ කරන ලදි

පල්ලියගොඩවත්ත ප්‍රදේශයට මේ වන විට අත් කරත්තයක් යොදවා ඇති බව මහජන සෞඛ්‍ය පරීක්ෂක ජයසේන මහතා සභාව දැනුවත් කරන ලදිග එහෙත් තවමත් පාර අයිනේ කැලිකසල ගොඩගසා තිබෙන බවත් ඒ තත්වය ඉදිරියේදී වෙනස් විය යුතු බවත් කසල පාරට දමන අයට විරුද්ධව මාර්ග අඥා පනත යටතේ නඩු පැවරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් කටයුතු කිරීම සුදුසු පවත් සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි

මිළගට සුමුදු ගෙස්ට් හවුස් ආයතනයේ වෙළඳ බලපත්‍ර ලබාගැනිම සම්බන්ධයෙන් වර්තමාන තත්වය පිළිබඳ සාකච්ඡා කරන ලදිග මහජන සෞඛ්‍ය පරීක්ෂක පී එස් එස් ද සිල්වා මහතා කථාකරමින් එම ස්ථානයට ගිය අවස්ථාවේ ඒ තැනැත්තා බැන වදින බවත්ල එම නිසා ස්ථාන පරීක්ෂාවක් සිදුකිරීමට උසාවි නියෝගයක් ලබාගනිමට ඉල්ලීම් කලද එය අසාර්ථක වු බවත් ප්‍රකාශ කරන ලදි

සභාපතිතුමා කථාකරමින් කියා සිටියේ වෙළඳ බලපත්‍ර ලබාගැනීමේදී එධ්‍ය වාර්ථාව ලබාගැනීම අත්‍යවශ්‍ය බව ඒ අයට පැහැදිලි කළේ ද යන්න ලේකම් මහතාගෙන් විමසන ලදිග ඔවුන් ඒ පිළිබඳ දැනුවත් කර ඇති බව ලේකම් මහතා පවසන ලදි

වෛද්‍ය පී ආර් එන් ද සිල්වා මිය කියාසිටියේ කිසිම නිළධාරියෙකුට රාජකාරි කටයුත්තක් ඉටු කිරීම සඳහා යා නොහැකි අන්දමින් බැන වදින බවත් එබැවින් මෙම කාර්ය ඉටු කිරීම තරමක් අසීරු බවයිගමේ ප්‍රශ්නය පළාත් පාලන කොමසාරිසිතුමාටද ගැටලුවක් වී ඇති බව එතුමා ප්‍රකාශ කල බවත් එබැවින් මේ සම්බන්ධයෙන් අධිකරණයෙන් විසදුමක් ලැබෙනතෙක් කටයුතු නොකිරීමට අප සියලු පාර්ශවයන් එකගත්වයකට පැමිණීම සුදුසු බවත් සභාපතිතුමා ප්‍රකාශ කරන ලදිග එයට සියලු දෙනාම එකගත්වය පළ කලහ

ඉන් අනතුරුව එළඹියේ වෙනත් කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමයිගගරු නගර සභා මන්ත්‍රී ජනික් වික්‍රමතිලක මහතා කථාකරමින් දේවානන්ද විද්‍යාලයට අද දින ගිය අවස්ථාවේ එහි කාණුවෙන් දුර්ගන්දයක් හමන බවට පැමිණිලි කල බව පැවසීය

ගරු සභාපතිතුමා කථාකරමින් එම කානුව මෑතකදී විශාල මුදලක් වැය කර සකස් කල ද එම ස්ථානයේ තිබු ගස ඉවත් කලා ද යන්න ජයසේන මහතාගෙන් විමසන ලදි

එයට පිළිතුරු දුන් මහජන සෞඛ්‍ය පරීක්ෂක ජයසේන මහතා එම ගස සම්පුර්ණයෙන්ම ඉවත් කල බවත් කාණුව සකස් කිරීමට පෙර වැසිකිලිවල කාණුවට කාන්දු වීමක් තිබු බවත් එම අවස්ථාවේ වැසිකිලිවල හිස්කිරීම නිසා ඒ තත්වය මගහැරී ඇති බවත් කාණුව මක ස්ලැබ් කැට දමා ඇති බැවින් දැන් එය නොපෙනෙන බවත් ප්‍රකාශ කරන ලදිග ගරු සභාපති තුමා කථා කරමින් එම වැසිකිලි වල හිස් කිරීම සිදු කොට කාන්දුව නැවැත්වීම සඳහා විදුහල්පති දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදි

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන කෙරම්නියගේ මහතා කථාකරමින් ඩෙංගු රෝග මර්ධනය සඳහා දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම සොයා ගෙන තිබුන ද ලඑම ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම සිදු නොවේද යන්න විමසන ලදීග එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා ඒවා පුවත්පත්වලට පමණක් සීමා වී ආති බව පවසන ලදීග බටහිර වෛද්‍ය ක්‍රමය හා දේශීය වෛද්‍ය ක්‍රමය එකට සම්බන්ධ වන අයුරින් ගර්භනි මාතාවන් සඳහා සායන පැවැත්වීම සිදු කල හැකිද යන්න වෛද්‍යතුමිය වෙතින් විමසන ලදිග එයට පිළිතුරු වශයෙන් වෛද්‍යතුමිය කියා සිටියේ ඒ ආකාරයෙන් සායන පවිැත්වමේදී ඇතිවන යම් යම් නොගැලපීම් මත ගැටලු ඇති වන බවයි

මහජන සෞඛ්‍ය පරීක්ෂක පී එස් එස් ද සිල්වා මහතා කථාකරමින් පටබැදිමුල්ල ප්‍රදේශයෙන් ඩෙංගු රෝගීන් කිපදෙනෙකු වාර්තා වී ඇති බැවින් ඒ පිළිබඳව අවශ්‍ය පියවර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.
ගරු සභාපතිතුමා කතා කරමින් සිකුරාදා දින එම ප්‍රදේශයේ ධුමායනය වැඩ සටහනක් සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

මහජන සෞඛ්‍ය පරීක්ෂක පී එස් එස් ද සිල්වා මහතා කථා කරමින් සායනවල එන්නත් ලබා දීමේදී කිසිවකු ක්ලානත් වුවහොත් ඒ තැනැත්තා රෝහල වෙත ගෙන යාම සඳහා වාහනයක් තිබිය යුතු බවත් එම සායන පැවැත්වෙන දින වලදී ධුමායන කටයුතු සඳහා වාහනය ලබා ගත නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී

ගරු සභාපති එම් ඩබ් අරුණ ප්‍රදිප් මහතා කථා කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහනයක් අපට ලැබී ඇති බවත්ල මුලින්ම එය ආයතනයට පවරා ගෙන අලුත් වැඩියා කලයුතු බවත් ප්‍රකාශ කරන ලදිග දුමායනය සඳහා වාහනය පිටතට ගෙනගොස් ඇති අවස්ථා වලදී සායනයේ අයෙකු හදිසියේ රෝහල් ගත කල යුතු වුවහොත් එවැනි අවස්ථාවක් සඳහා කුලියට වාහනයක් ලබා ගන්නා ලෙස දල මේ යෝජනාව සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු පව ද පවසන ලදි

ජයසේන මහතා කථා කරමින් මදුරුවන් බෝවන ස්ථාන සඳහා දුමායනය සිදු කිරීමේදී වෙනත් සතුන් විනාශ වීම වළැක්විය නොහැකි බවත් පැවසිය. මෙමගින් බලාපොරොත්තු වන්නේ ඩෙංගු රෝගීන් බෝවීම වළක්වා ලීම බව පැවසිය

ගරු සභාපතිතුමා කථා කරමින් නිවසක ජල බදුනක් තබා එයට ගප්පි මසුන් දැමීම මගින් මදුරුවන් ඒ තුල බිත්තර දැම්මක් ගප්පි මගින් එම බිත්තර විනාශ විමත් සිදු වන බව පවසන ලදිග
මගසෞගපග මහතා කථාකරමින් පොල්වත්ත ක්‍රීඩාපිටිය අසල ඇති පොදු නාන ලිද දැනට භාවිතා නොවන නිසා එම ළිද වසා දැමීම සුදුසු බව පවසන ලදි

ගරු සභාපතිතුමා කථාකරමින් බල ප්‍රදේශයේ බොහෝ ස්ථානවල තිබූ ළිං කඩා ඉවත් කිරීමත් සමග එම ඉඩම් සභාවට අහිමි වීමේ ප්‍රවනතාවක් පවතින බවත් පිටස්තර පුද්ගලයන් එම ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීම හෝ පෞද්ගලික පරිහරණයට යොදාගැනීමක් සිදුවන බැවින් එම ළිද වසා දැමීම එතරම් සුදුසු නොවන බව පවසන ලදිග බලප්‍රදේශයේ පොදු නාන ළිං ඉසීම සිදුකර ඒවාට ගප්පි මසුන් දමන ලෙස ජ්‍යෂ ජයසේන මහතාට උපදෙස් දෙන ලදි

ගරු නගර සභා මන්ත්‍රී ජනිත් වික්‍රමතිලක මහතා කථාකරමින් ළිංවල දැමීම සඳහා අවශ්‍ය ගප්පි මසුනු තමාට ලබාදිය හැකි බව පවසන ලදි

ගරු නගරසභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිනිය මහතා කථාකරීන් පතිරාජ පටු මග හා දුවවත්ත පාර කාණු පිරිසිදු කල යුතුබව පවසන ලදිග නිවෙස් වලට පැමිණ ජලභීතිකා රෝග මර්ධනය සඳහා එන්නත් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද යන්න පවසන ලදි

වෛද්‍ය පී ආර් එන් ද සිල්වා මිය කියා සිටියේ එම කාර්ය ක්‍රියාත්මක වන බවයි
එවැනි සායන පැවැත්වීමේදී එම කාර්ය පහසු විම සඳහා මානාන ක්‍රීඩා පිටියට යාබදව පිහිටි ගොඩනැගිල්ල යොදා ගත හැකි බව ගරු සභාපතිතුමා පවසන ලදි

ඕකන්ද ග්‍රාම නිලධාරී එච් එච් ඒ ද සිල්වා මහතා කථාකරමින් තල්ගස්ගොඩ ප්‍රදේශයේ කසල දැමීමේ ගැටලු සහගත තත්වයක් පැන නැගී ඇති බව පවසන ලදි

ගරු සභාපතිතුමා කථාකරමින් පොලිසියට මෙම කාර්ය ඉටු කිරීම පහසු බවත් තිලකපුර ගොඩහේන ප්‍රදෙශ වලින් පාන්දර නගරයට පැමිණෙන මිනිසුන් තල්ගස්ගොඩ ප්‍රදේශයේ කසල දැමීම සිදු කරන බවත් පවසන ලදි ජ්‍යෂ මහතුන්ට මෙය වලකා හැකිබවත්පවසන ලදි වෙනත් කරුණු නොවු හෙයින් ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්තුති කථාව සිදුකරන ලදි

මෙම කමිටුව මසකට වරක්වත් රැස්වීම සම්බන්ධයෙන් සභාපතිතුමාට ස්තුතිකරන බවත්සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතුමියක් මේ පිළිබඳ උනන්දුවෙන් කටයුතු කිරීමත් ජ්‍යෂ මහතුන්ගෙන් ඒ සඳහා ලැබෙන සහයත් ඉකා අගය කොට සලකන බවත් අද දින සහභාගි වු සියලු දෙනාටම ස්තුතිය පුද කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි

සකස් කළේ,　　　　　　　　　　　　　　　　ලේකම්,
අම්බලන්ගොඩ - නගර සභාව.

**ඒ අනුව 2013 -12- 12 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 12- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව</u>**

**<u>කළමනාකරණ කමිටු වාර්තාව</u>**

| | | | | |
|---|---|---|---|---|
| දිනය | : | 2013-12-24 | | |
| ස්ථානය | : | නගර සභාව අම්බලන්ගොඩ | | |
| වේලාව | : | ප.ව 2.30 | | |
| සහභාගීත්වය | : | භාරත සමරසේකර මයා | – | ලේකම් |
| | | ඩී. ඩබ්. පද්මසිරි මයා | – | ගණකාධිකාරී |
| | | සිසිර කුමාර මයා | – | කර්මාන්ත අධිකාරී |
| | | ශාන්ති ඩි රාමනායක මිය | – | ප්‍රධාන කළමනාකරණ සහකාර |
| | | එස්. නිර්මලා ද සිල්වා මිය | – | ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම් |
| | | පී. එස්. එස්. ද සිල්වා මයා | – | මහජන සෞඛ්‍ය පරීක්‍ෂක |
| | | ඩබ්. පී. සිල්වා මිය | – | ප්‍රජා සංවර්ධන නිළධාරී |
| | | කේ. සී. සී. ප්‍රනාන්දු මිය | – | අභ්‍යන්තර විගණන නිළධාරී |
| | | කේ. එච්. මෙලානි මදුෂා මිය | – | පුස්තකාලාධිපති |
| | | පී. එම්. ටී. විමලධර්ම මෙව් | – | සංවර්ධන නිළධාරී |

01 පිළිගැනීම : සියලුම දෙනා පිළිගන්නා අතර කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදී

–ලේකම්

➢ **ආයතන අංශය**

- පත්වීම් ලිපි සකස් කරමින් පවතින බවත් හිග වැටුප් වල ප්‍රශ්නයක් පවතින බව ප්‍රකාශ කරන ලදී

- ප්‍රධාන කළමනාකරණ සහකාර

- ප. සෞ. සේ කෝඩිතුවක්කු මියගේ උසස් වීමට අදාල වැටුප් සකස් කර ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී

- ලේකම්

- පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත කළමණාකරන සහකාර සේවය සහ තාක්ෂණික සේවයේ පෞද්ගලික ලිපි ගොනු භාර දිය යුතු බැවින් එවා යාවත්කාලින කිරීමට ප්‍රමාද වු බව ප්‍රකාශ කරන ලදී

- ප්‍රධාන කළමනාකරණ සහකාර

➢ **කර්මානත අංශය**

- මාර්ග අලුත් වැඩියා කිරීමට අවශ්‍ය කොලාස් මිළ දී ගැනිමේ මුල්‍යමය ගැටලුවක් පවතින බවත් වාහන අලුත් වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනිමේ ගැටලුවක්ද පවත්න බව ප්‍රකාශ කරන ලදී
- කම්කරුවන්ගේ අතිකාල දිමනා ගෙවිමේ ගැටලුවක්ද පවත්න බව ප්‍රකාශ කරන ලදී
- තල්ගස්ගොඩ පාලම අවිච්පේද කිරීමට ඉල්ලිමක් කරන ලෙස සම්පත් මහතාට දැනුම් දුන් බව ප්‍රකාශ කරන ලදී

- කර්මාන්ත අධිකාරී

➢ **සෞඛ්‍ය අංශය**

- අතුරු ඇළ මාර්ගයක් සුද්ද කිරීමට අපහසු බවත් කසල දමන ස්ථානයට යන මාර්ගයෙ අබලන් වි ඇති බැවින් කුනු බැහැර කිරිම නිවස් ආසන්නයෙ සිදු වු විට ප්‍රශ්ණ රැසක් ඇතිවන බව ප්‍රකාශ කරන ලදී
- කම්කරුවන්ගේ අතිකාල දිමනා හා ගලියේ දිමනා නිසි පරිදි ලබා නොදිම ගැටලුවක් බවත් ඔවුන් මුදල් ඉල්ලන්නේ මුදල් හම්බ කර දි ඉන් කොටසක් බව ප්‍රකාශ කරන ලදී

- මහජන සෞඛ්‍ය පරීක්ෂක

- මෙම මිනිසුන්ගේ ප්‍රශ්නය සාධාරණ බවත්, මෙම තත්වයට විසදුමක් ලෙස යෝජනා 03කින් යුතු වාර්තාවක් සභාවට ඉදිරිපත් කර ද තවම විසදුමක් නොමැති බව ප්‍රකාශ කරන ලදී

- ගණකාධිකාරී

➢ **ප්‍රජා අංශය**

- පොත් බෙදාදීම ග්‍රමිය මට්ටමෙන් ඉතා සාර්ථකව ඉටු කර බවත් තවමත් අයදුම් පත් ගෙන එන බව ප්‍රකාශ කරන ලදී

- ප්‍රජා සංවර්ධන නිළධාරි

- එම අයදුම් පත් ලබා නොගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී

- ප්‍රධාන කළමනාකරණ සහකාර

➢ **ගිණුම් අංශය**

- කර්මාන්ත හා සෞඛ්‍ය අංශයේ මිනිසුන්ගේ හිඟ වැටුප් ප්‍රශ්නය සාධාරණ බවත්, මෙම තත්වයට විසඳුමක් ලෙස යෝජනා 03කින් යුතු වාර්තාවක් සභාවට ඉදිරිපත් කළ ද තවම විසඳුමක් ගෙන නොමැති බවත් නැවත එම වාර්තාව සමාලෝචනය කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී
- වව්චර් ඉදිරිපත් කිරීමේදී ගැටලු පවතින බවත්, ප්‍රමාද වී ගෙන එන වව්චර් වල රතුපාටින් සටහනක් දමන බවත්, එම ප්‍රමාද වීම් අවම කර ගැනීම සඳහා කටයුතු කළයුතු බව ප්‍රකාශ කරන ලදී
- දෙසැම්බර් මස 20වැනි දින සියලුම දෙනාට වැටුප් ලබා දීමට කටයුතු කළ බවත්, බැංකුවට යවන්න තිබුණ සියලුම චෙක්පත් 19වන දින දහවල් 12ට පෙර සකස්කර අවසන් කරද එය 19,20 දිනවල බැංකුවට දමා නොමැත. 21 හා 22 දිනයන් නිවාඩු වු බවත් 23 වන දිනද මෙම චෙක්පත් බැංකුවට දමා නොමැත. පසුව අදාළ නිළධාරීන්ගෙ ප්‍රශ්න කිරීම් නිසා ඉහත තත්වය සොයාගනු ලැබීය. නැවත මෙවැනි ගැටලුකාරී තත්වයන් ඇති නොවන ලෙස කටයුතු කිරීම සඳහා නිදහසට කරුණු විමසිය යුතු බව ප්‍රකාශ කරන ලදී
- 2014 අවුරුද්දේදී  ආරම්භ කරන ලද පරිගණක වැඩසටහනට අවශ්‍ය සියලුම පහසුකම් ලබා දී ඇති බවත් වයඹ සංවර්ධන අධිකාරියේ නිළධාරීන් පැමිණ සහයෝගය ලබා දී ඇති බව ප්‍රකාශ කරන ලදී
- වයඹ අධිකාරියේ ද අඩුපාඩු ඇති බවත්, ඔවුන් එය නගර සභාව වෙත යොමු කිරීමට උත්සහා කරන බවත් එම නිසා මෙම ප්‍රශ්න මගහරවා ගැනීම සඳහා මෙම මාසය තුල පෙර පුහුණුවක් ලබා ගැනීමට කටයුතු කල යුතු බව ප්‍රකාශ කරන ලදී
- පරිගණකවලට මුදුකාංග ආරක්ෂිතයක් (වෛරස් ගාර්ඩ්) දැම්ම ආරම්භ කර ඇති බවත් ඒවා මිළදී ගැනීමේදී වඩාත් සහනදායි ලෙස මිළදී ගැනීම සිදු කල බවත්, මෙම මුදුකාංග ආරක්ෂිතයක් (වෛරස් ගාර්ඩ්) පරිගණක සඳහා යොමු කිරීමේදී ඒ බව ලිඛිතව සටහන් කිරීමක් වැදගත්වේ. එහිදී පරිගණකය ක්‍රියාකරු විසින් ඒ බව ලිඛිතව සටහන් කිරීම කලයුතුබව  ප්‍රකාශ කරන ලදී
- ආදායම් අංශයේ තොරතුරු භාරකරු ලෙස නිලන්ති මිය පත් කර ඇති අතර වියදම් අංශයට ගීතිකා ලක්මාලි මිය පත් කර ඇත. මෙහිදී වයඹ අධිකාරියේ ලැබෙ සම්පත් වල දායකත්වය කුමක් ද? ගැටලු මොනවාද? නගර සභාව විසින් ගතයුතු පියවර මොනවා ද? ආදී පිළිබඳව වාර්තාවක් ලැබිය යුතුබව ප්‍රකාශ කරන ලදී
- හිඟ වරිපනම් සම්බන්දයෙන් ප්‍රශ්නයක් ඇති බව එනම් වරිපනම් එකතු කළ ලීලාරත්න මයා සිදුකළ හොරකම් නිසා නගර සභාවටද අපකීර්තියක් සිදුවී ඇති බවත්, ඔහුට වරිපනම් ගෙවූ මිනිසුන්ටද අසාධාරනයක් සිදුවන නිසා මෙම තත්වයට පිළියමක් වශයෙන් නැවතත් පොලිසියට පැමිණිල්ලක් දැම්ම සිදුකල යුතු බව ප්‍රකාශ කරන ලදී

– ගණකාධිකාරී

➢ **ආදායම් අංශය**

- හිඟ වරිපනම් එකතු කිරීමට අවශ්‍ය බවත්, 50,000ට වැඩි වරිපනම් ජනවාරි 31ට පෙර නොගෙවූ විට දෙපළ තහනමකට යන බවත්, තල්ගස්ගොඩ සමහර ඉඩම් හඳුනා ගැනීමට නොහැකි බව ප්‍රකාශ කරන ලදී

– ප්‍රධාන කළමනාකරණ සහකාර ආදායම්

- තල්ගස්ගොඩ ඉඩම් හඳුනා ගැනීම සඳහා උප සභාපතිතුමාගේ සහය ලබාගත හැකි බව ප්‍රකාශ කරන ලදී

– ප්‍රධාන කළමනාකරණ සහකාර

➢ **පුස්තකාල අංශය**

- පොත් බැඳීමට අවශ්‍ය උපකරන නොලැබීම පිළිබඳව  ප්‍රකාශ කරන ලදී

- පුස්තකාලාධිපති

- ඒ සම්බන්දයෙන් වාර්තාවන් සභාවට ඉදිරිපත් කළයුතු බව ප්‍රකාශ කරන ලදී

– ප්‍රධාන කළමනාකරණ සහකාර

**ඒ අනුව 2013 -12- 24 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 4** **2013- 12- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන පුස්තකාලයේ විමර්ශන අංශයේදී පවත්වන ලද**

**පුස්තකාල කමිටු වාර්තාව.**

| | |
|---|---|
| ■ ශාන්ති ඩී. රාමනායක මිය | (ප්‍රධාන කළමණාකරණ සහකාර) |
| ■ කේ.එච්. මෙලානි මධුෂා මිය | (පුස්තකාලයාධිපති) |
| ■ පීනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ එන්.එච්. ඩන්කන් ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ සිරිපාල මාදුවගේ මහතා | (කමිටු සාමාජික) |
| ■ සුගත් හෙට්ටි ආරච්චි මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ හර්බට් වීරක්කොඩි මහතා | (කමිටු සාමාජික) |
| ■ ටී.ඩබ්. පියසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ ජේ.ඩබ්.ජේ. ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ජී.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | (පුස්තකාල සාහායක) |
| ■ ගෞරි වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ජී.පී. රසිකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ කේ.ජී. විසුද්ධි රේණුකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ මාලතී සමන්තා ආරියසිංහ මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එම්.ඩබ්. පීනේකා සුමංගලි මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ජී.පී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය | (පුස්තකාල සාහායිකා) |

ගරු සභාපතිතුමාට කමිටුවට පැමිණීමට නොහැකි බව තමාට දැනුම් දුන් බව ප්‍රධාන කළමණාකරණ සහකාරතුමිය විසින් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා හා ලේකම් මහතාද සහභාගි නොවූ බැවින් එතුමිය කමිටුවේ වැඩ ආරම්භ කළාය.

■ **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපති කේ.එච්. මෙලානි මදුෂා මහත්මිය විසින් ද, අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ද, ඉදිරිපත් කරන ලදී. විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව සංවර්ධන නිලධාරි ටී. නදීකා නිල්මිණි මෙනවිය නිවාඩු බැවින් පුස්තකාල සහායිකා පියන්ති මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදී.

**අදහස් හා යෝජනා:-**

■ පුස්තකාල ප්‍රගති වාර්තාව අනුව කමිටු සාමාජික ඩන්කන් මහතා කියා සිටියේ පුස්තකාල සාමාජිකත්වය ලබාගෙන ඇත්තේ වැඩිපුර වැඩිහිටි සාමාජිකයින් බවයි. පුස්තකාලයේ වැඩිපුර සාමාජිකත්වය ලබාගත යුතු වන්නේ සිසුන් බවයි. එහිදී පුස්තකාලයාධිපතිනිය කියා සිටියේ වයස අවුරුදු 10-13 දක්වා වයස් කාණ්ඩවල ළමුන් සිසුන් හැටියටත්, අවුරුදු 13 ට වැඩි පුද්ගලයින් වැඩිහිටි අයදුම්කරුවන් ලෙස පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගන්නා බවයි. සිසුන් සාමාජිකයින් නොවන්නේ පාසල් වලත් සාමාජිකයින් වන නිසාද, ඔවුන්ට සතියකට බැහැර ගෙන යාමට පාසල් වලින් පොත් දෙන නිසා බවත් කමිටු සාමාජික පීනේන්ද්‍රවංශ මහතා කරුණු දැක්වුයේය. පුස්තකාලවල සාහායිකාවන්ට දෝෂාරෝපණය කිරීමෙන් කිසිදු ඵලක් නොමැති බව කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා පැවසීය.

■ කෙරමිණිය පුස්තකාලයේ සිටින සිසු සාමාජික සංඛ්‍යාව 71 ක් වුවත් හිරේවත්ත එම සංඛ්‍යාව 08 ක් බවද, නමුත් ඇති පොත් සංඛ්‍යාව හිරේවත්තේ 1642 බවද, කෙරමිණියේ 1648 ක් බවත්ද, මෙයින් කෙරමිණියේ පුස්තකාලයට අසාධාරණයක් බැවින් හිරේවත්ත පුස්තකාලයෙන් පොත් සංඛ්‍යාවක් කෙරමිණිය පුස්තකාලයට පවරාදීම සාධාරණ බැව් පීනේන්ද්‍රවංශ මහතා පැවසීය. හිරේවත්ත පුස්තකාලයේ සාමාජිකයින් අඩුවීමට හේතුව ලෙස පෙනී යන්නේ එම පුස්තකාලය නුසුදුසු ස්ථානයක පිහිටා තිබීම බව කමිටු සාමාජික පීනේන්ද්‍රවංශ මහතා විසින් වැඩිදුරටත් කරුණු දක්වමින් කියා සිටින ලදි.

■ අම්බලන්ගොඩ නගරසභා පුස්තකාලය දෙවන ශ්‍රේණියේ පුස්තකාලයක් බවත් ඒ අනුව සඟරා 10 ක් අනිවාර්යෙන්ම පුස්තකාලයේ තිබිය යුතු බවත් කමිටු සාමාජික පීනේන්ද්‍රවංශ මහතා විසින් කරුණු දක්වන ලදි. ප්‍රධාන පුස්තකාලයේ සඟරා තුනක් දැනට පරිහරණය කරන බැවින් සඟරා 7 ක් ගැනීම සුදුසු බවද කමිටු සාමාජික මහතුන්ගේ තීරණය විය. හොඳම පුස්තකාලය තේරීමේදි ලකුණු දෙන ආකාරය අනුව සඟරා අඩු බැවින් එම ලකුණු කැපෙන බවත් පීනේන්ද්‍රවංශ මහතා පෙන්වා දෙන ලදි. එම සඟරා 10 ලබා ගැනීමට අපහසු නම් සඟරා 10 ක් ලබා දීමට කටයුතු කරන බව ඒ සඳහා වැයවන මුදල පසුව එතුමාට ලැබීමට කටයුතු කරන ලෙස පුස්තකාලයාධිපතිනියගෙන් ඉල්ලීමක් කරන ලදී.

■ ලංකාවේ තිබෙන හොඳම විද්‍යුත් පුස්තකාලය තියෙන්නේ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අයි.ටී. ඩිජිටල් පුස්තකාලය බවත් ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ උපදෙස් අවශ්‍ය වූ සෑම අවස්ථාවක ලබා ගැනීමට හැකිබවත් පීනේන්ද්‍රවංශ මහතා කරුණු දක්වන ලදි. පුස්තකාලයේ සංයුක්ත තැටි 139 ක් තිබෙන බවත් පුස්තකාලයාධිපතිනිය පැවසුවාය. එම සංයුක්ත තැටි කුමන අංශ යටතේ විෂයන් අනුව තිබෙන්නේද යන්න ඊළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස කමිටු සාමාජිකයෝ පැවසූහ. පුස්තකාල පොත් සංසරණ ප්‍රස්තාරයේම එය සඳහන් කලයුතු බව කමිටු සාමාජික මහතුන්ගේ තීරණය විය. එය ලබන කමිටු රැස්වීමට ලැබීමට සලස්වන බව පුස්තකාලයාධිපතිනිය ප්‍රකාශ කළාය.

■ ආපන ශාලාවේ තිබෙන අපවිත්‍ර දේ පුස්තකාලයේ කාණුවට දැමීම අප්‍රසන්න බවත්, එම අපිරිසිදුතාවය ගැන පිළියමක් කරන ලෙස කමිටු සාමාජික ඩන්කන් මහතා පෙන්වා දෙන ලදි. මේ සඳහා සෞඛ්‍ය පරීක්ෂක මහතකුට පොතක් තබා පිරිසිදුකම සඳහන්කර අත්සනක් තබා ගැනීම සුදුසු බව ඩන්කන් මහතා පැවසීය.

■ සාහිත්‍ය දින උත්සවයට ප්‍රධාන අමාත්‍යතුමා හා සංස්කෘතික ඇමතිතුමා නොපැමිණීම ගැන ඩන්කන් මහතා සඳහන් කළේය. ඒ ගැන වරදක් කිව නොහැකි වැදගත් දේශපාලන කටයුක්තකට සහභාගී වීමට සිදුවීම අනිවාර්ය වූ නිසා එතුමන්ලාට උත්සවයට සහභාගිවීමට නොලැබුණු බව පීනේන්ද්‍රවංශ මහතා පැවසීය. මෙතුමන්ලාගේ නොපැමිණීම කලින් ප්‍රකාශ වුයේ නම් සැමදෙනාගේම උද්යෝගය අඩුවන බවත් පීනේන්ද්‍රවංශ මහතා පෙන්වා දෙන ලදි.

■ අළුත් පුස්තකාල ගොඩනැගිල්ල ගැන සාමාජික සුදත් හෙට්ටිආරච්චි මහතා විමසන ලදි. මේ ප්‍රශ්නය ගැන කීපවතාවක්ම ගරු සභාපතිතුමා විස්තර සමග පැවසූ බවත් වැඩිදුරටත් පීනේන්ද්‍රවංශ මහතා නැවතත් එම විස්තරය කමිටුවේ දැන ගැනීම පිණිස පැවසීය. ප්‍රධාන කළමණාකාර සහකාර තුමිය ස්තූති කථාව සඳහා පුස්තකාලයාධිපතිනියට

ආරාධනා කළාය. එහිදි එතුමිය ස්වේච්ජාවෙන් කමිටුවට පැමිණි ප්‍රධාන කළමණාකාරතුමිය, කමිටු සාමාජික මහතුන්, පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළහ.

**ඒ අනුව 2013 -12- 24 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

### 7:1 ටෙන්ඩර් හා මිළගණන් :-

**7:1:1 ටෙන්ඩර්** :- **නැත**

### 7:2 මිල ගණන් :-

**7:2:1** පරණ පුවත්පත් අලෙවිය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් වැඩිම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩබ්.ජේ. ද සිල්වා | එස්.ඩබ්.විමලසේන | ආර්.එම්.පී. ද සිල්වා |
|---|---|---|---|---|---|
| 01 | පත්තර (ලොකු) | 1 kg | **7/-** | 5/75 | 6/- |
| 02 | පත්තර (කුඩා) | 1 kg | **5/-** | 2/- | 3/- |
| 03 | ගැසට් පත්තර | 1 kg | 2/- | **3/-** | 1.50 |

**7:2:2** ගබඩා භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විජේසූරිය මෝටර්ස් | උමංග ලුබ්රිකන්ට් | සුමනදාස සර්විස් සෙන්ටර් |
|---|---|---|---|---|---|
| 01 | F 00zH 20308 ඔයිල් ෆිල්ටර් | | | | **1432/-** |
| 02 | 253418130169 ඔයිල් ෆිල්ටර් | | | | **2039/-** |
| 03 | SAE 15W-40 කැල්ටෙක්ස් ඩෙලෝ ගෝල්ඩ් | | 7320/- | **7300/-** | 7320/- |
| 04 | 80W - 90 ඩෙලෝ මැනුවල් ට්‍රාන්ස්මිෂන් ඔයිල් | | 4080/- | **4050/-** | 4225/- |
| 05 | SSAE 140 කැල්ටෙක්ස් | | **685/-** | 14150/- | 805/- |
| 06 | වීල් බෙයරින් ග්‍රීස් | | **550/-** | 580/- | 750/- |
| 07 | ATF 11 D කැල්ටෙක්ස් | | **835/-** | - | 1365/- |

**7:2:3** ගබඩා භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Fa Enterprises | | |
|---|---|---|---|---|---|
| 01 | හුළං කොකු පිත්තල | | **225/-** | | |
| 02 | 2 ½" සොයිබ පිත්තල | | **185/-** | | |
| 03 | 4" සොයිබ පිත්තල | | **215/-** | | |
| 04 | 3/4" නො 06 පිත්තල ඇණ | | **8/04** | | |
| 05 | 1/2" නො 05 පිත්තල ඇණ | | **5/-** | | |
| 06 | මල්ටිබොන්ඩ් ගම් | | **1880/-** | | |

**7:2:4** Pen Drive සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වියුලිප් කම්පියුටර්ස් | ඔමැක් ටෙක්නොලොජි | එල්. එස්. ජේ. කම්පැනි |
|---|---|---|---|---|---|
| | Pen Drive 4 GB | | **700/-** | 750/- | ලැබී නැත |
| | Pen Drive 8 GB | | **880/-** | 902/- | |
| | Pen Drive 16 GB | | **1400/-** | 1500/- | |
| | Pen Drive 32 GB | | 3250/- | **3100/-** | |
| | Pen Drive 64 GB | | 6700/- | **5600/-** | |

**7:2:5** Multi Media Speker System සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වියුලිප් කම්පියුටර්ස් | ඔමැක් ටෙක්නොලොජි | |
|---|---|---|---|---|---|
| | Multi media Speker System | 4:1 | 6100/- | 3900/- | |
| | | 2:1 | 3800/- | 900/- | |
| | | Normal | **600/-** | 400/- | |

**7:2:6** විදුලි උපාංග සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | උදය පුෂ්පා | ජ්මියන් ඉලෙක්ට්‍රිකල්ස් | |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| | මේන් ස්විච් | | **<u>1510/-</u>** | ලැබී නැත | |
| | ට්‍රිප් ස්විච් | | **<u>4018/-</u>** | | |
| | බ්‍රේකර් | | **<u>614/-</u>** | | |
| | ත්‍රී ගෑන් සවිච් | | **<u>335/-</u>** | | |
| | 4" ටියුබ් ලයිට් | | **<u>998/-</u>** | | |
| | 56" සිවිලිං විදුලි පංකා | | **<u>3200/-</u>** | | |
| | ABC පෙට්ටි | | **<u>590/-</u>** | | |
| | බස් බාර් | | **<u>15/-</u>** | | |
| | ඇන්කල් හෝල්ඩර් | | **<u>103/-</u>** | | |
| | ෆිලින් රෝස් | | **<u>45/-</u>** | | |

**7:2:7** Printers සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඔමැක් ටෙක්නොලොජි | එල්.එස්.ජේ කම්පියුටර්ස් | |
|---|---|---|---|---|---|
| | Epson LQ 310 Printer | | **<u>24250/-</u>** | 30000/- | |
| | | | | | |

**7:2:8** Web Camera සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩිජිටල් කම්පියුටර්ස් | ඔමැක් ටෙක්නොලොජි | කෝඩියන් ටෙක්නොලොජි |
|---|---|---|---|---|---|
| | Web Camera | | 2000/- | 1900/- | 2200/- |
| | | | | | |

**7:2:9** ගබඩා භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විජේසූරිය මෝටර්ස් | උමංග ලුබ්රිකන්ට් | සුමනදාස සර්විස් සෙන්ටර් |
|---|---|---|---|---|---|
| 01 | SAE – 15 W 40 මොබිල් | | 129950/- | 90900/- | - |
| 02 | MP 90 ගියර් ඔයිල් | | 540/- | 580/- | 3105/- |
| 03 | ඩිපරන්සයිල් ඔයිල් | | 540/- | 580/- | 3105/- |
| 04 | H D 68 හයිඩ්‍රොලික් ඔයිල් | | 17200/- | **<u>17200/-</u>** | 17270/- |
| 05 | පවර් ස්ටියරින් ඔයිල් | | 835/- | **<u>835/-</u>** | 835/- |
| 06 | ග්ලාස් ක්ලීනර් | | 200/- | **<u>175/-</u>** | 200/- |
| 07 | ඩැෂ්බෝඩ් තිනර් | | **<u>285/-</u>** | 350/- | 300/- |
| 08 | හයිප්‍රෙශර් | | - | **<u>700/-</u>** | 900/- |

| | | | | | |
|---|---|---|---|---|---|
| 09 | පිනෝල් | | - | **<u>800/-</u>** | 950/- |
| 10 | ග්‍රීස් | | 720/- | **<u>600/-</u>** | 750/- |
| 11 | බැටරි වතුර | | 70/- | **<u>60/-</u>** | 70/- |

**7:2:10** Toner සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඔමැක් ටෙක්නොලොජි | කෝඩියන් ටෙක්නොලොජි | ඩිජිටල් කම්පියුටර්ස් |
|---|---|---|---|---|---|
| | HP 85A Toner | | 6750/- | 7500/- | 7800/- |
| | 85A compatible torner | | 4500/- | | |
| | | | | | |

**7:2:11** පරිගණක උපාංග සඳහා මිල ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ශිවා කම්පියුටර්ස් | එල්.එස්.ජේ කම්පියුටර්ස් | රම්සි කම්පියුටර්ස් |
|---|---|---|---|---|---|
| | Internet Security 3 users Virus Guard | | 3450/- | 3400/- | 3470/- |
| | | | | | |

**7:2:12** විදුලි උපාංග සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | උදය පුෂ්පා | ජමියන් ඉලෙක්ට්‍රිකල්ස් | ඩී. කේ. එස්. |
|---|---|---|---|---|---|
| | මර්කරි බල්බ් | | 390/- | 410/- | |
| | ඇම්ප් | | 700/- | 275/- | |
| | ෂේඩ් | | 750/- | 275/- | |
| | ටී ඔෆ් කනෙක්ටර් | | 195/- | 175/- | |
| | අයන් ග්ලාස් ස්විච් | | 2390/- | 2450/- | |
| | වන් ගැන්ක් ස්විච් (32Amp) | | 135/- | 120/- | |
| | වන් ගැන්ක් ස්විච් | | 1720/- | 1600/- | |
| | 1/044 වයර් | | 75/- | 20/- 70/- | |
| | CG හෝල්ඩර් | | 25/- | 75/- | |

**7:2:13** විදුලි උපාංග සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | උදය පුෂ්පා | | |
|---|---|---|---|---|---|
| | 7/0 85 - (Twin) wire | | 200.70 | | |
| | 62 A අයිසොලේටර් | | 2270/- | | |
| | 62 A ට්‍රිප් ස්විච් | | 6500/- | | |
| | 1" කන්ඩියුට් බට | | 98/- | | |

## (08) ගෙවීම්

8. 1 ඇ. අංක 0733 යටතේ ලබා ගත් Tyre සඳහා ගාලු පාර, අම්බලන්ගොඩ, ආසිරි ටයර් සර්විසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 65624/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

215/80 R 15 Tyres 04 X 16406 - 65624/-

8.2 ඇ. අංක 0746 යටතේ ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලු පාර, චාමර බුක් ෂොප් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 30600/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| A4 තද පාට 10 X 835/- | - | 8350.00 |
| A4 ලා පාට 25 X 710/- | - | 17750.00 |
| A4 මිශ්‍ර පාට 10 X 450/- | - | 4500.00 |
| | | 30600.00 |

8. 3 ඇ. අංක 0747, 0751 යටතේ ලබා ගත් ලිපිද්‍රව්‍ය සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 56025/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| A4 papers 65 X 550/- | - | 35750.00 |
| File Tags 2000 X 3/50 | - | 7000.00 |
| Legal papers 05 X 775/- | - | 3875.00 |
| Type Writing Sheet 20 X 370/- | - | 7400.00 |
| Box File 10 X 200/- | - | 2000.00 |
| | | 56025.00 |

8.4 ඇ. අංක 0720 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද කාර්යාලීය උපකරණ වෙනුවෙන් අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, ඔමැක් ටෙක්නොලොජිස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 64000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| Fan Machine 01 X 17500/- | - | 17500.00 |
| Scanner machine 01 X 7500/- | - | 7500.00 |
| Printer 03 X 13000/- | - | 39000.00 |
| | | 64000.00 |

8.5 ඇ. අංක 0776 යටතේ ලබා ගන්නා ලද CFL බල්බ් සඳහා පරණ කැස්බෑව පාර, බොරලැස්ගමුව පොලිකෝම් ඉලෙක්ට්‍රිකල්ස් ඉන්ඩස්ට්‍රීස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 79968/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| CFL Bulbs 18W 200 X 357/- | - | 71400.00 |
| Vat | - | 8568.00 |
| | | 79968.00 |

8.6 ඇ. අංක 0774 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද Gas වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Gas 08 X 7240 - 57920/-

8.7 ඇ. අංක 0775 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද කම්ප්‍රෙෂර් යන්ත්‍රය වෙනුවෙන් කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, මාර්ක්වින් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 67750/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Air Compressur 1 X 67750/- - 67750/-

8.8 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 නොවැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 28342.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4345 | ඩීසල් | 52 |
| | එන්ජින් ඔයිල් | 06 |
| 4350 | ඩීසල් | 32 |
| | පවර් ස්ටියරින් ඔයිල් | 01 |
| | එයාර් ෆෙෂ්නර් බෝතල් | 01 |
| | ටීපෝල් බෝතල් | 01 |
| 4360 | ඩීසල් | 54 |
| 4365 | ඩීසල් | 62 |

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙම ගෙවීම කරලද තියෙන්නෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තවම නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඔක්තෝම්බර් මාසෙ ගෙවීම කරලද?

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගෙවීම කරල

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඔක්තෝම්බර් මාසෙ 15 - 30 දක්වා ගෙවීම සභාවෙ අනුමැතියට දාල තිබුණෙ නැහැ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක නිලධාරීන්ගෙ කාර්යභාරයක්.

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණයගේ මහතා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද තුනකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.9 නගර සභාව සතු GL- 9369 අංක දරණ ගලිබවුසර රථය සඳහා 2013 නොවැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 18899.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4356 | DS-30 Engine Oil | 05 |
| 4369 | ඩීසල් | 137 |

8.10 නගර සභාව සතු 49- 9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 නොවැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13446.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4348 | ඩීසල් | 45 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 4367 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4373 | ඩීසල් | 14 |

8.11 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 නොවැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17647.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4339 | ඩීසල් | 42 |
| | එන්ජින් ඔයිල් | 04 |
| 4354 | ඩීසල් | 44 |
| 4374 | ඩීසල් | 48 |

8.12 නගර සභාව සතු 49 - 9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 නොවැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15392.8 0 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4340 | ඩීසල් | 35 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4355 | ඩීසල් | 41 |
| | එවර් ස්ටියරින් ඔයිල් | 01 |
| 4372 | ඩීසල් | 42 |

8.13 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 නොවැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 28907.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4380 | ඩීසල් | 55 |
| 4385 | ඩීසල් | 54 |
| 4391 | ඩීසල් | 71 |
| 4400 | ඩීසල් | 54 |
| | එන්ජින් ඔයිල් | 01 |

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙතුමාල විරුද්ධ වෙන්නෙ මේ සංවර්ධන කටයුතු වලට තියෙන කැබ් රථයේ ඉන්ධන සම්බන්ධයෙන්. එකක් මදි නිසයි මහ ඇමතිතුමාට කියල තව එකක් ගෙනාවෙ. මෙතන වාහන ගරු සභාපතිතුමාටත් තියෙනවා. මටත් තියෙනවා. මේක අනිසි විදියට පාවිච්චි කරන්නෙ නැහැ. මෙතුමාල දිගින් දිගටම මේකට විරුද්ධ වෙනවා මෑතක ඉඳන්. කලින් නම් විරුද්ධ වුනේ නැහැ. මොන හේතුවක් නිසා විරුද්ධ වෙනවද කියල නම් දන්නෙ නැහැ. මෙතුමාලගේ ප්‍රදේශ වලත් සංවර්ධන කටයුතු වලට නිලධාරීන් යන්නෙ එන්නෙ මේ වාහනෙන්. මේක දුවන්නෙ වතුර ගහල නෙමෙයිනෙ. එනිසා සභාපතිතුමනි මේ සම්බන්ධව අපේ කණගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ කැබ් රථය සභාවට පරිභාහිරව අනිසි දේවල් වලට පාවිච්චි වෙනවා. ඒ නිසා තමයි අපි මේ තෙල් පාවිච්චි වීමට විරුද්ධ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පළාත් පාලන ආයතන සෑම එකකම පාහේ සභාවේ කැබ් රථය කියල එකක් නෙමෙයි තියෙන්නෙ සභාපතිතුමාගෙ බැබ්එක කියලා. නමුත් මම එහෙම පාවිච්චි කරන්නෙ නැහැ. නිලධාරීන් ගියත් මම ගියත් කවුරු ගියත් රනින් චාර්ට් එක අත්සන් කරනවා. අභ්‍යන්තර විගණන නිලධාරීන් එය පරීක්ෂා කරල තමයි ඊලග තෙල් නිකුත් කිරීම කරන්නෙ. ඊට අමතරව ඒ විගණන වාර්තා විගණන දෙපාර්තමේන්තුවටත් යනවා. ඒ කිසිම තැනකින් අපට අද වෙනතුරු කිසිම චෝදනාවක් එල්ල වෙලා නැහැ. පෞද්ගලිකව මට වාහනයක් තියෙනවා උප සභාපතිතුමාට තියෙනවා. අපි අපේ ගමන් අපේ වාහන වල යනවා. ඔය විරුද්ධ වෙන විපක්ෂ මන්ත්‍රීවරුත් මේ වාහනේ ගමන් ගිහිල්ල තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔබතුමාගෙ ප්‍රකාශයට අපි විරුද්ධයි. අපි මේ වාහනේ පුද්ගලික දේවල් වලට කිසිම වෙලාවක පාවිච්චි කරල නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්ලිව්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔබතුමාගෙ ප්‍රකාශෙ අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. අපි මේ කැබ් එකේ ගිහිල්ල නැහැ. අපේ පාලන කාලෙ එක දවසක් පොලිසියට ගිහිල්ල තියෙනවා. අපි යන්නෙ චුවමනාවකටම විතරයි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මාසෙට දවස් 30 යි තියෙන්නෙ. නිලධාරීන් එක්කෙනා බැගින් දිනපතා ගියත් කීයක්ද? මේක වාද විවාද කරන්න තරම් දෙයක් නෙමෙයි. විපක්ෂ මන්ත්‍රීවරුන්ට විරුද්ධ වෙන්න අයිතියක් තිබෙනවා. නමුත් ඒක සාධාරණ විය යුතුයි. පහුගිය දිනවල ප්‍රජා මණ්ඩල 13 ක් පිහිටවනු ලැබුවා. එක ප්‍රජා මණ්ඩලයකට 10 වතාවක් මේ වාහනය යන්න ඇති. වාහන තියෙන නිසා තමයි මේ සංවර්ධන කටයුතු පහසු වෙලා තියෙන්නෙ. ඒ නිසා මෙය අකර්මණ්‍ය කිරීමක් කරන්න එපා. මොකද දූෂණ කටයුතු වලට මෙම වාහන යොදා ගන්නව නම් විරුද්ධ වෙන එක සාධාරණයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම කියන්න ඕනෙ මගේ පුද්ගලික වාහනය කි මී 103000 ක් දුවල තියෙනව එයින් සභාවෙ වැඩ වලට කි මී 75000 ක් විතර දුවල තියෙනවා. ටයර් හතරක් මාරු කරල තියෙනවා. එකක් රු. 52000 යි. ඉතින් මේ මහජන කටයුතු වෙනුවෙන් පාපැදියකවත් ටයර් මාරු කරපු නැති අය තමයි විරුද්ධ වෙන්නෙ. විරුද්ධ වෙන්න ඕනෙ සාධාරණව. මහජනතාව වෙනුවෙන් අපි අපේ දෙවලුත් කැප කරල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ කරනු ලබන සංවර්ධන කටයුතු ජාලය තුල පොත් බෙදාදීම් උත්සවම 13 ක් තිබුණා. ඒ සඳහා වාර කියක් මේ රථය ගමන් කරන්න ඇතිද? පසුගිය සභා වාරයන්හිදී ඔබතුමන්ලා විරුද්ධ වුනහම අපි සද්ද නැතිව හිටියා. යම් සිද්ධියක් අපි දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු වෙන්න ඇති කියල. වර්ෂ අවසානයේ අපේනිලධාරීන් නිරන්තර එහා මෙහා ගාලු කොළඹ යවන්නට සිදු වුනා ඉදිරි වර්ෂය සඳහා මුදල් ගෙන්වා ගැනීම් සිදු කිරීමට. සභාපතිතුමනි වෙනත් සභාවල සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන් භුක්ති විදින වරප්‍රසාද ඇත්තටම අපි භුක්ති විදින්නෙ නැහැ. අපි අපේ පුද්ගලික වාහන වලින් පවා නිලධාරීන් රැගෙන යනවා රාජකාරී කටයුතු සඳහා. අපි එහෙම කරන්නෙ මහජනතාවගේ පොදු කටයුතු වෙනුවෙන්. අපේ ඉන්නෙ ගහට පොත්ත වගේ දේශපාලනය ඇගට දැනෙන මන්ත්‍රීවරු කොටසක්. මේ දෙවල් වලදී අපට සියුම් වේදනාවක් ඇති වෙනවා. මොකද විපක්‍ෂෙ ඉන්න මන්ත්‍රීවරු අපි ගැන හොඳට දන්න කියන අය නිසා. අපි කියන්නෙ යම්කිසි කාරණයක් තියෙනව නම් අපිවත් දැනුවත් කරන්න. තමුන්නාන්සේලාගෙ විපක්‍ෂ කාර්යභාරය ඉටු කරන්න. එතකොට අපිත් එතනට එනවා.

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්‍ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්‍ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණයගේ මහතා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අයද , විපක්‍ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද තුනකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.14 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 නොවැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13926.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4379 | ඩීසල් | 73 |
| 4398 | ඩීසල් | 42 |

8.15 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසර රථය සඳහා 2013 නොවැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17559.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4390 | ඩීසල් | 145 |

8.16 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 නොවැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 25818.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4387 | ඩීසල් | 42 |
| | එන්ජින් ඔයිල් | 10 |
| 4396 | ගියර් ඔයිල් | 20 |
| 4403 | ඩීසල් | 31 |

8:17 2013 ඔක්තෝම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11453 I | 48884.40 |
| 23453 I | 1720.51 |
| 34453 I | 3087.26 |
| 52453 I | 108914.39 |
| 53454 | 16844.12 |
| 62453 I | 28064.53 |
| | 207515.21 |

විදුලි බිල්පත් සඳහා රු. **207515.21** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

8:18 2013 සැප්තැම්බර්/ ඔක්තෝම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් | ඔක්තෝම්බර් |
|---|---|---|
| 52453 II | 27901.50 | 27494.30 |
| 62453 II | 16457.80 | 15439.36 |
| 34453 II | 1163.68 | 1080.80 |
| 23453 II | 14740.64 | 7382.36 |
| 11453 II | 7663.04 | 7403.20 |
| | **67926.66** | **58800.02** |

ජල බිල්පත් සඳහා රු: **126726.68** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

8:19 2013 ඔක්තෝම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11452 | 28938.58 |
| 12452 | 1163.28 |
| 25451 II | 2211.24 |
| 62452 I | 2512.00 |
| | **34825.10** |

දුරකතන බිල්පත සඳහා රු **34825.10** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

8.20 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා නොවැම්බර් මාසයට සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 37120/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.21 2013 නොවැම්බර් මස වැට් බදු ආපසු ගෙවීම සඳහා රු. 50000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.22 සිරි නිකේතාරාම පටුමග 01 මාර්ගය සංවර්ධනය කිරීම - අතිරේක වැඩ කර්මාන්තයේ ගෙවීම් මුදල වන රු. 16953.00 ක මුදලක් වැඩ අධිකාරී නිර්දේශය හා ලේකම්ගේ අනුමැතිය පරිදි ආර්. ඒ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.23 පළාත් නිශ්චිත-2013 සංවර්ධන වැඩසටහන යටතේ හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ වර්. අං. 21-26 චක්වා නිවාස අසලින් යන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 98112.89 ක මුදලක් වැඩ අධිකාරී නිර්දේශය හා ලේකම්ගේ අනුමැතිය පරිදි හෙප්පුමුල්ල ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.24 පළාත් නිශ්චිත-2013 සංවර්ධන වැඩසටහන යටතේ හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ වර්. අං. 21-26 චක්වා නිවාස අසලින් යන මාර්ගය (අතිරේක වැඩ) කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 2397.00 ක මුදලක් වැඩ අධිකාරී නිර්දේශය හා ලේකම්ගේ අනුමැතිය පරිදි හෙප්පුමුල්ල ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 අම්බලන්ගොඩ ධීවර වරාය පරිශ්‍රයේ ඇති අයිස් සමාගම සඳහා විදුලිය ලබා ගැනීමට ධීවර වෙළඳසැල් හරස් පාර එක් පසක කාණු කරුපීම වෙනුවෙන් නගර සභාවට තරන්පත් මුදල් වශයෙන් ගෙවනු ලැබූ රු. 300000.00 ක තැන්පත් මුදල අදාල සමාගම වෙත වැඩ අධිකාරී නිර්දේශය හා ලේකම්ගේ අනුමැතිය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 මහ අම්බලන්ගොඩ සද්ධාසේන මාවත කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 76644.37 ක මුදලක් jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh පරිදි අංක 86, පොල්වත්ත එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයට පිවිසෙන රණසූරිය පාර අවසාන කොටස හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ ගෙවීම් මුදල වන රු. 959416.64 ක මුදලක් jev wêldÍ ks¾foaYh yd f,alïf.a

wkque;sh පරිදි පටබැඳිමුල්ල ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ගෙවීමටත් එහි ප්‍රතිපාදන මුදල ඉක්මවා වියම් වී ඇති රු. 159416.64 ක මුදල සභා අරමුදලින් දැරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 තල්ගස්ගොඩ ප්‍රධාන පාරේ වරිපනම් අංක 27 ඒ අසලින් ඇති හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීමේ කර්මාන්තයේ ගෙවීම් මුදල වන රු. 499862.77 ක මුදලක් jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh පරිදි තල්ගස්ගොඩ සුදුවැල්ල කුඩා ගම්මාන සමෘද්ධි සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 අම්බලන්ගොඩ කරිත්තකන්ද 1 පටුමග (අදියර 1) කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ගෙවීම් මුදල වන රු. 484766.73 ක මුදලක් jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh පරිදි තල්ගස්ගොඩ සුදුවැල්ල කුඩා ගම්මාන සමෘද්ධි සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:30 RA-8796 g%elagrfha w¨;ajeähdjg wjYH Wmdx. ,nd .ekSu fjkqfjka re' 10270.40 l uqo,la jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh mßos " ãi,a wekaâ fudag¾ bxcskshßka mSt,aiS "wdh;kh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:31 fymamquq,a, fmr mdi, yd mqia;ld, f.dvke.s,af,a isú,sx iúlsÍu l¾udka;fha wjidk f.jSu jk re' 501406.52 l uqo,la jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh mßos mgne|suq,a, .%dóh iuDoaê iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:32 uqyqÿ fjr< mdr ldKq fldgila fldkal%SÜ lsÍu l¾udka;fha fldgia f.jSu jk re' 243926.31 l uqo,la jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh mßos mgne|suq,a, .%dóh iuDoaê iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:33 k.r iNd wdhq¾fõo f.dvke.s,a, ldh j¾Ok uOHia:dkhla f,i kùlrKh lsÍu ^1 woshr& l¾udka;fha fldgia f.jSu jk re' 684392.48 l uqo,la jev wêldÍ ks¾foaYh yd f,alïf.a wkque;sh mßos wd¾' B' o is,ajd udj; l=vd .ïudk iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙම ගෙවීමට මොන කොටස්ද අයිති.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩ අධිකාරී මහතා ඒක විස්තර කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි පාරවල් හදද්දි හැම එකේදීම ගෙවීමේදී ටෙස්ටින් රිපෝට් ගන්නවා. මේකෙදි ගත්තද කියන එකයි මම අහන්නෙ. ඇයි ගන්නෙ නැත්තෙ. මගෙන් මේ සභාවෙ කොන්ත්‍රාත් කරන කෙනෙක් ඇව්ල්ල ඇහුව ඇයි මේකට ටෙස්ටින් ගන්නෙ නැත්තෙ කියලා. ඒකයි මම ඇහුවෙ. පාරෙ කොන්ක්‍රීට් එකට වඩා ලොකුයි ස්ලැබ් එකේ කොන්ක්‍රීට් එක.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වැඩ අධිකාරී මහතා ඒක ඇතුල් නොකරෙ ඇයි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

වැඩ අධිකාරී මහතා නිදහසට කරුණු කියන්න එපා. මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි මීට පස්සෙ පාරවල් වලට ටෙස්ටින් ගන්න එපා. එතුමාට වගකීම ගන්න කියන්න.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වැඩ අධිකාරී මහතා මේකට ටෙස්ටින් රිපෝට් එකක් දාන්න ඕනෙ. වගකීම ඔයාට තියෙන්නෙ.

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණියගේ මහතා යන අය ඡන්දය ලබා දුන් අතර විපක්ෂව එක් ඡන්දයක්වත් නොලැබුණි. ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී. ඒ අනුව ඡන්ද පහකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8:34 k.r iNd wdhq¾fõo f.dvke.s,a, ldh j¾Ok uOHia:dkhla f,i kùlrKh lsÍu ^2 woshr& l¾udka;fha fldgia f.jSu jk re' 178016.36 l uqo,la වැඩ අධිකාරී නිර්දේශය හා ලේකම්ගේ අනුමැතිය mßos wd¾' B' o is,ajd udj; l=vd .ïudk iñ;sh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණියගේ මහතා යන අය ඡන්දය ලබා දුන් අතර විපක්ෂව එක් ඡන්දයක්වත් නොලැබුණි. ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී. ඒ අනුව ඡන්ද පහකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8:35 Y%S ,xld m<d;a md,k wdh;khkaf.a ixiofha jd¾Isl idudcsl uqo, jk re' 10000.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos Y%S ,xld m<d;a md,k wdh;khkaf.a ixioh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:36 2014 whjeh f,aLk nhskaäka lsÍu yd j¾K uqøs; msgm;a ,nd .ekSu fjkqfjka re' 10600.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos vhukaâ weâjghsiska wdh;kh fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:37 ;lafiare oekaùï uqøKh lsÍu fjkqfjka tia' f¾Kqld ks,ka;s ñhg re' 8918.00 la yd ;lafiare oekaùï fnodyeÍu fjkqfjka tï' k,ska pkaøcs;a uy;dg re' 34492.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:38 ys. jßmkï nÿ tl;=lsÍu fjkqfjka tÉ' à' iS' tÉ' o is,ajd uy;dg re' 12926.82 l uqo,la f,alïf.a ks¾foaYh mßos f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:39 2013/12/10 isg 2014/12/10 olajd uqo,a rCIKh fjkqfjka re' 18780.42 l uqo,la f,alïf.a ks¾foaYh mßos Y%S ,xld bkaIqjrkaia fldamf¾Ika ,sñgâ fj; f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:40 cd;sl Y%u wOHhk wdh;kh u.ska meje;afjk M,odhS;d mqyqKq jevigyka i|yd ks,OdÍka 05 fofkl= iyNd.s lrùu fjkqfjka tu wdh;khg re' 15000/- l uqo,la f,alïf.a ks¾foaYh mßos f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

8:41 .re iNdm;s;=ud" Wm iNdm;s;=ud we;=¨ uka;%Sjrekaf.a .uka úhoï oSukdj re' 30000/- l uqo,la f,alïf.a ks¾foaYh mßos f.ùug iNdfõ wkque;sh ,nd දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 නොවැම්බර් මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 නොවැම්බර් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**(10)** ඇස්තමේන්තු

**10:1** බුද්ධදත්ත මාවත 1 වන හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 172414.17 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:2** පෝරඹ තොටුපොල පටුමග අන්තර් සම්බනධිත ගල් ඇතිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 288861.04 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:3** පින්නදූව පොදු ළිද ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 99147.07 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:4** පින්නදූව පාර කාණු කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 482296.27 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:5** මාලිනී ලුවිස් මහත්මියගේ නිවස අසලින් ඇති කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 917451.54 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:6** හෙප්පුමුල්ල පෙරපාසැල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ (අතිරේක වැඩ) කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද re' 181430.51 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:7** පොල්වත්ත ක්‍රීඩාපිටියේ ඇති ක්‍රීඩා මණ්ඩපය සහ පුස්තකාලය පින්තාරු කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රe' 211715.35 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:8** ධීවර සංකීර්ණය පින්තාරු කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රe' 536132.85 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10:9** දේවානන්ද විද්‍යාලය පිටුපස ඇති කාණුව ස්ලැබ් දමා වසා දැමීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රe' 259072.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්,</u>**

සභාපතිතුමනි පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාලෙකින් පින්තාරු කරල නැහැ. මගෙන් කඩ හිමියන් නිතරම ඒ ගැන විමසනවා.

[redacted]

**(11)**

11:1 “ දෛනික දීමනාව වැඩිකර ගැනීමේ කාරුණික ඉල්ලීමයි ” මැයෙන් නගර සභාවේ විශේෂ ව්‍යාපෘති සේවයේ සේවකයන් 12 දෙනෙකුගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තමන් නගර සභාවේ විශේෂ ව්‍යාපෘතියට සම්බන්ධව දැනට වසර ගණනාවක් සේවය කරන බවත් දැනට වැටුප වශයෙන් ලැබෙනුයේ දිනකට රු. 566/- ක මුදලක් බවත් එය කිසිසේත්ම ජීවත්වීම සඳහා ප්‍රමාණවත් නොවන බවත් එම නිසා වැටුප වැඩිකර දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **සෞඛ්‍ය අංශයේ විශේෂ ව්‍යාපෘතිය යටතේ සේවය කරන සේවකයන් සඳහා දැනට ගෙවනු ලබන දීමනාව 2014-01-01 දින සිට වැඩි කර දෛනික වැටුප වශයෙන් රු. 694.65 ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

11:2 “ 2013 ඔක්තෝම්බර් මස වාර්තාව ” මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීතුමා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 08 ක් බවත් ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 100 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 12 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධ වල වටිනාකම රු. 9155.96 ක් බවත් රෝගියකු සඳහා වැයවූ මුදල රු. 91.55 ක් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

11:3 “ 2013 නොවැම්බර් මස වාර්තාව ” මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීතුමා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 05 ක් බවත් ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 85 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 17 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධ වල වටිනාකම රු. 8891.56 ක් බවත් රෝගියකු සඳහා වැයවූ මුදල රු. 104.61 ක් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

11:4 “ මාර්ගය සභාවට පවරාගෙන සංවර්ධනය කර ගැනීම සම්බන්ධවයි ” මැයෙන් අම්බලන්ගොඩ දලුක්කන්ද කාලගිරි විහාරයේ විහාරාධිපති නාහිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

දලුක්කන්ද කාලගිරි විහාරස්ථානයට ඇතුලුවන මාර්ගය ගමන් කිරීමට පවා අපහසු තත්වයේ පවතින බවත් මෙම මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කර දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **දලුක්කන්ද කාලගිරි විහාරස්ථානයට ඇතුලුවන මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමටත් අදාල රු. 144574.65 වූ ඇස්තමේන්තුව ද විශේෂ කරුණක් සේ සලකා අනුමත කිරීමටත් සභාව තීරණය කරන ලදී.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **‘** අම්බලන්ගොඩ නගර මධ්‍යයේ බැනරයක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධවයි **’** මැයෙන් ILEAD ආයතනය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

තම ආයතනය අඩු ආදායම්ලාභී තරුණ ප්‍රජාව සඳහා වෘත්තිය දැනුම නොමිලේ ලබා දෙන ආයතනයක් බවත් විශේෂ අවශ්‍යතා සහිත තරුණ පිරිස සමාජගත කිරීමේ අරමුණින් ඒ සඳහා අරමුදලක් පිහිටුවා ගැනීම අරමුණු කොට 2013 දෙසැම්බර් 22 වන දින ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පා ගමනක් පැවැත්වෙන බවත් ඒ පිළිබඳ දැනුවත් කිරීමේ බැනරයක් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ඉදිරිපිට භූමියේ නොමිලේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **බැනරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා මුදල් අය කිරීමකින් තොරව සහ අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** **‘** අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ උපහාර උත්සවය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු ලබා ගැනීම **’** මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ උපහාර උත්සවය 2013- 11- 29 වෙනි දින ප. ව. 2.00 ට අම්බලන්ගොඩ පුරහලේ දී පැවැත්වෙන බවත් ඒ සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු 450 ක් නොමිලයේ ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **උපහාර උත්සවය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු 450 ක් නොමිලයේ ලබා දීමට සහා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ' නගර සභාව සඳහා සුදු කොඩි 100 ක් ලබා ගැනීමට කරන ඉල්ලීම ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව සතුව දැනට පවතින සුදු වර්ණයෙන් යුත් 2 X 10 ප්‍රමාණයේ කොඩි ප්‍රමාණවත් නොවන බවත් එමනිසා තවත් සුදු කොඩි 100 ක් මිල ගණන් කැඳවා මිලදී ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙය ඉතා කාලෝචිත යෝජනාවක්. මෙම කොඩි අවමගුල් උත්සව වලට ගෙනිච්චහම නැවත පිරිසිදු කරන ක්‍රමවේදයකුත් හදනව නම් හොදයි. ඩෝබි කෙනෙකුට දාල කෙලින්ම පිරිසිදු කරන ක්‍රමවේදයක් හදනව නම් හොදයි. අවශ්‍යනම් පොඩි ගානක් අය කරමු.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මේ කොඩි ලබා දීම සිදු කරන්නෙ ඉටි කොල භාවිතය වැලැක්වීම සඳහායි. පරිසර හිතකාමී වැඩ පිළිවෙලක් විදියට. ඒ නිසා මේකට අපි අය කිරීමක් කරන්න බැහැ. වියදම අපි දරමු. අවමගුල් උත්සව තුනකට කොඩි දැම්මට පස්සෙ ලොන්ඩරියට දාල පිරිසිදු කරන්න ක්‍රමයක් හදමු. ඒ යන වියදම සභාවෙන් දරමු.

**තීරණය**

☞ **සුදු වර්ණයෙන් යුත් කොඩි 100 ක් මිලදී ගැනීමටත් අවමගුල් උත්සව තුනකට යෙදීමෙන් පසු ලොන්ඩරියට දමා පිරිසිදු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් ගෙවීම් කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ' නගර සභාවේ ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ලබා ගැනීම සඳහා ' මැයෙන් අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සංගමයේ 35 වන වර්ෂ පූර්ණ සංවත්සරය සැමරීම වෙනුවෙන් බැඩ්මින්ටන් තරග මාලාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙම තරගාවලිය සඳහා සහභාගී වීමට නියමිත බවත් 2014-01-09, 10, 11 යන දිනයන්හි මෙම තරග පැවැත්වීමට නියමිත බවත් ඒ සඳහා නගර සභාව සතු බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **බැඩ්මින්ටන් තරගාවලිය සඳහා 50% ක් ගාස්තු අයකර නගර සභාව සතු බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ' ආදේශක තනතුරක් සම්බන්ධවයි " මැයෙන් ප්‍රධාන කලමනාකරණ සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පී. එච්. සහන් සංකල්ප නැමති අයට ආදේශක වෙළඳපොල භාරකරු තනතුරක් ලබා දීම සඳහා අනුමැතිය ලැබී ඇති බවත් එම තනතුරේ බඳවාගැනීමේ බලධාරියා දෙපාර්තමේන්තු ප්‍රධානියා බැවින් ඔහුගේ අනුමැතිය ලබා ගත යුතු බවත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **පී. එච්. සහන් සංකල්ප මහතාට ආදේශක වෙළඳපොල භාරකරු තනතුරක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ' පෙර පාසල් නිල ඇඳුම් සඳහා මැහුම් කුලී ගෙවීමට අනුමැතිය ලබා ගැනීම පිලිබඳ " මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා පෙර පාසල් දරු දැරියන්ට ලබා දෙන නිල ඇඳුම් මසා ගැනීම සඳහා වැය වන කුළිය ගෙවීමට ආර්ථික දුෂ්කරතා ඇති දෙමාපියන්ට නොහැකි බවත් ඒ සඳහා වන කුළියද ලබා දෙන ලෙස දෙමාපියන් විසින් ඉල්ලීම් කර ඇති බවත් ඒ සඳහා වන ඇස්තමේන්තුව එක් ළමයෙකුට රු. 200.00 බැගින් ළමයින් 200 සඳහා රු. 40000.00 ක් බවත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **නගර සභා පෙර පාසල් දරු දැරියන්ට ලබා දෙන නිල ඇඳුම් මසා ගැනීම සඳහා වැය වන මැහුම් කුළිය ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ' යකඩ පයිප්ප සම්බන්ධ කොට තාවකාලික සෙවනක් ඉදිකිරීම " මැයෙන් අම්බලන්ගොඩ, ගාලුපාර, අංක 11 පී හි ලලිත් හැළඹගේ මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

2014 නව වසරේ අම්බලන්ගොඩ ''දොළොස් මහේ'' සල්පිලට නන් දෙසින් මහජනතාව ගලා එන බවත් ඔවුන්ගේ පහසුව සඳහා මෙහි වාසය කරන නිවැසියන්ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවහිරයක් නොවන අයුරින් යකඩ පයිප්ප භාවිතා කර තාවකාලික සෙවනක් සකස් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අම්බලන්ගොඩ නගරය වෙනද ප්‍රසිද්ධ වෙලා තිබුනෙ අධ්‍යාපනඥයින්ගෙ සහ උගතුන්ගේ පාරාදීසයක් ලෙස. අද වන විට රෙදි පිළිවලට ප්‍රසිද්ධ පුරවරයක් ලෙස අම්බලන්ගොඩ ප්‍රසිද්ධ වෙලා තියෙනවා. එහිදී මූලික වන දොළොස් මහේ සේල් පොල ව්‍යාපාරික ස්ථානය ප්‍රමුඛ වෙනවා. එම ආයතනය ප්‍රදේශයට සේවාවක් සපයන ව්‍යාපාරික ස්ථානයක් හැටියට අපි අගය කරන්න ඕනෙ. ඉදිරි මාස කිහිපය තුලදී අපි විශ්වාස කරනවා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මෙම ව්‍යාපාරික ස්ථානය කරා ඒකරාශී වෙයි කියලා. අපි සභාවක් හැටියට පාරිභෝගික ජනතාව වෙනුවෙන් ගත යුතු ක්‍රියා මාර්ග තියෙනවා. එතුමාල මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් බලාපොරොත්තු වෙන්නෙ ඒ තුලින් එහි එන ජනතාවට ඒ

තුලින් සහනදායි තත්වයක් ඇති වෙනවා. මෙම තාවකාලික ඉදිකිරීම මම පුද්ගලිකව කැමතියි හැමදාටම තියෙන විදියට මේ දේ කරන්න පුලුවන්නම්. මම දැකල තියෙනව සිංගප්පූරුව මැලේසියාව වගේ රටවල මෙවැනි ක්ෂණික ඉදිකිරීම් කරනව ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යාම සඳහා. එම නිසා මෙම කාරණයට පුද්ගලිකව මගේ එකගතාවය පල කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙම ඉල්ලීමට අපි මන්ත්‍රීවරු විදියට කැමැත්ත දෙනවා ලිපියට අත්සන් යොදල. සෑම වසරකම සිංහල හින්දු අවුරුද්දට මේ අම්බලන්ගොඩ නගරයට ඇදී එන සුවිශාල ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් මෙම දොළොස්මහේ සේල් පොල සඳහා රෙදිපිලි ගැනීමට නන් දෙසින් පැමිණෙන ජනතාවගෙන් යුක්ත වෙනවා. මෙම ආයතනය පුද්ගලික වුනත් ජනතාව පොදුයි. ඒ පොදු ජනතාව වෙනුවෙනුයි මේ අධිපතිතුමන් ඉල්ලීම කරල තියෙන්නෙ. එතුමා ඉල්ලීම කරන්නෙ ව්‍යාපාරික කටයුතු එතන කරන්න නෙමෙයි. පොදු ජනතාවට සෙවනක් ලබා දීම සඳහායි. මේක වැරදි අර්ථකථනයට කතා කරන්න පුලුවන්. අපගේ එකගතාවය අපි ලබා දෙනු ලබන්නේ මේ අව්වෙන් වැස්සෙන් පීඩා විදින මහජනතාවට සෙතක් සහනයක් ලබා දීම සඳහා වෙනුවෙන් බව ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මේක ජනතාව වෙනුවෙන් ඔවුන්ට කරන සේවයක් ලෙස සලකා ගියවරත් මෙය ලබා දුන්නා. අපිට දෙතුන් දෙනෙක් මේකට දොස් කිව්වා. නමුත් ජනතාවට සේවයක් කෙරෙන ආකාරයේ දෙයක් වෙනව නම් හරි දේ කරන්නට අපි පෙළඹෙනව. ජනතාව වෙනුවෙන් පෞද්ගලික ව්‍යාපාරිකයෙක් හරි යම් දෙයක් කරනව නම් ඒක හොඳ දෙයක්නම් ඒ සඳහා අපි ඒ සඳහා ඉඩ ලබා දීම සාධාරණයි. අම්බලන්ගොඩ නගරයට පැමිණෙන ජනතාව වෙනුවෙන් පෞද්ගලික ව්‍යාපාරිකයෙක් මේ ආකාරයට උනන්දු වීම සම්බන්ධව නගර සභාව වෙනුවෙන් ස්තූතිවන්ත වෙනව. ඒවගේම මම ඉල්ලා සිටිනවා පාරෙ අයිනටම වෙන්නට එය ඉදිකිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**<u>තීරණය</u>**

☛ **වැඩ අධිකාරී මහතාගේ අධීක්ෂණය යටතේ යකඩ පයිප්ප වලින් සෙවනක් ඉදි කිරීම සඳහා අවසර ලබා දීමටත් එය අලුත් අවුරුදු උත්සව සමය නිමවන තුරු පමණක් භාවිතා කිරීම සිදු කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ‘ මු. පි. ගා. 2314 හි පෝරොක් ඇලට යාබදව පිහිටි ඉඩම් තීරුව “ මැයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පෝරොක් ඇලට යාබදව පිහිටි ඉඩම් තීරුව මෙම සංස්ථාව විසින් අත්පත් කරගත් කොටසක් බවත් බලපිටිය දිසා අධිකරණයේ විභාග වූ නඩු විභාගය අවසානයේදී මෙම ඉඩම් තීරුව එම නඩුවේ පැමිණිලි පාර්ශවයට ප්‍රවේශ මාර්ගයක් වශයෙන් පාවිච්චි කිරීමට ඉඩදීමට තීන්දු වූ බවත් අනතුරුව ඇල නඩත්තු කිරීමේ කටයුතු වලට උපයෝගි කර ගැනීමේ කාර්යට යටත්ව මෙම ඉඩම් කොටසේ භුක්තිය නගර සභාවට භාර දී ඇති බවත් මෙම ඉඩම් තීරුවේ කොටසක් ප්‍රදේශයේ සුබ සාධක සංගමයක් විසින් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා උපයෝගි කර ගැනීම සඳහා සැලැස්මක් ඇති බවට මෙම සංස්ථාව වෙත පැමිණිලි ලැබී ඇති බවත් එසේ සැලැස්මක් ඇතිනම් මෙම ඉදිකිරීම් වැලැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් දන්වා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම කොටසේ තියෙන යහසාධක සංගමය කරපු ඉල්ලීමට 2013-10-08 දින සභාවේ අංක 12 : 11 මගින් අනුමැතිය ලබා දුන්නා. එනිසා නගර සභාවට මෙම කොටස පැවරී ඇති ප්‍රමාණයට බාහිර ප්‍රමාණයක් අපට පවරන්න බැහැ. ඉල්ලීම අපි

නිර්දේශ කරල පාරට අසු නොවන කොටසේ මෙම ඉදිකිරීම් කිරීමට අනුමැතිය දීම වඩා සුදුසුයි කියල ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට දැන්වීම යෝග්‍යයි කියල මම යෝජනා කරනවා.

තීරණය

☞ **පාරට අසු නොවන කොටසේ මෙම ඉදිකිරීම් කිරීමට අනුමැතිය දීම වඩා සුදුසු බව දන්වා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට දැන්වීමට සභාව තීරණය කරන ලදී.**

**12:9** ‘ **Kularathniyan’s Mega – 2014** වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය “ මැයෙන් ගා/ පී. ද එස්. කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයට ආධාර පිණිස 2014 අප්‍රියෙල් මස 02 සිට 06 දක්වා වෙළඳ ප්‍රදර්ශනයක් හා සැණකෙළියක් නගර සභා පිටියේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් මෙයින් ලැබෙන ආදායම විද්‍යාලයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදා ගන්නා බවත් මෙහි ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **Kularathniyan’s Mega – 2014 වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළියෙන් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:10** ‘ විශේෂ ව්‍යාපෘතිය (සෞඛ්‍ය) යටතේ සේවකයන් බඳවා ගැනීම - 2014 ” මැයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

සෞඛ්‍ය අංශයේ පිරිසිදු කිරීම් කටයුතු සඳහා දැනට සිටින ස්ථිර සේවකයන් ප්‍රමාණවත් නොවන බවත් විශේෂ ව්‍යාපෘතිය යටතේ 2014- 01- 01 දින සිට 2014- 12- 31 දින දක්වා කසල බැහැරලීම සඳහා සේවකයන් 10 ක් ද කාණු පිරිසිදු කිරීම සඳහා සේවකයන් 05 ක් ද රියදුරන් 05 ක් ද බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **සෞඛ්‍ය අංශය සඳහා විශේෂ ව්‍යාපෘතිය යටතේ 2014- 01- 01 දින සිට 2014- 12- 31 දින දක්වා කසල බැහැරලීම සඳහා සේවකයන් 10 ක් ද කාණු පිරිසිදු කිරීම සඳහා සේවකයන් 05 ක් ද රියදුරන් 05 ක් ද බඳවා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ‘ පටබැඳිමුල්ල නගර සභා සායනයේ සහායිකාව වෙනුවට සේවය කල සේවිකාවට දීමනාව ගෙවීම “ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පටබැඳිමුල්ල නගර සභා සායනයේ සායන සහායිකාව ලෙස කටයුතු කල කේ. ඩබ්. නිල්මිනි මිය වෙනුවට තාවකාලිකව කේ. ඩබ්. කමනි මිය සේවය කල බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය විසින් දන්වා ඇති බවත් ඒ අනුව කේ. ඩබ්. කමනි මියට සහායිකා දීමනාව ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **කේ. ඩබ්. කමනි මියට සහායිකා දීමනාව ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** **'** මුදල් ගෙවීමට අනුමැතිය ලබා ගැනීම **'** මැයෙන් සැපයුම් නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පරිගණක සඳහා වෛරස් ගාඩ් ඇතුලත් කිරීම, මෘදුකාංග ඇතුලත් කිරීම ආදී කාර්යන් ඉටුකිරීම වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලුපාර, එල් එස් ජේ කම්පියුටර්ස් වෙත රු. 25700.00 ක මුදලක් ගෙවිය යුතු බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි න්‍යාය පත්‍රයට ඇතුලත් නොකර වෙනත් කරුණු යටතේ මෙය ඉදිරිපත් කිරීම නිසා මෙම ගෙවීමට මම විරුද්ධ වෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ගෙවීම හදිසි කටයුත්තක්. මොකද 2014 වසරේ සියලුම ආදායම් සම්පූර්ණයෙන්ම පරිගණක ගත කරා. ඒ අනුව 2014-12-31 රාත්‍රී 12 වන විට නගර සභාවට ලැබෙනවා ඒ මොහොතේම අවසාන ගිණුම ලබා ගැනීමේ පහසුකම. ඒ පරිගණක තාක්ෂණවේදයට අනුගත කරපු නිසා. මම හිතන්නෙ දකුණු පළාතෙම තියෙන පළවෙනි නගර සභාව මෙවැනි කටයුත්තක් කරපු. මෙවැනි පරිගණක පද්ධතියක් භාවිතා කිරීමේදී " වයිරස් ගාර්ඩ් " යෙදීම ඉතාමත්ම අවශ්‍යම දෙයක්. මේ සම්බන්ධයෙන් දැනුමක් නැති අය විරුද්ධ වීම ගැන කණගාටු වෙනවා. ඒ සම්බන්ධයෙන් මම විශේෂ ගෙවීමක් ලෙස සලකල මේ අවස්ථාවේ ඡන්දය විමසනවා.

<u>තීරණය</u>

☞ **මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීමට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අය ඡන්දය ලබා දුන් අතර විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා ඡන්දය ලබා දෙ ලදී. ඒ අනුව වැඩි ඡන්ද පහකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

**12:13** **'** ජෙනරේටර යන්ත්‍රයක් ඉල්ලීම **'** මැයෙන් එස්. රේණුකා නිලාන්ති මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014- 01- 01 දින සිට නගර සභාවේ ආදායම් වියදම් සියල්ල පරිගණකගත කර ගිණුම් කටයුතු පරිගණක ආධාරයෙන් සිදු කිරීමට නියමිත බැවින් විදුලිය ඇණ හිටීමක් ඇති වුව හොත් එය බාධාවක් වන බවත් එම නිසා ජෙනරේටරයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ජෙනරේටර යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ‘ 2014 වර්ෂයේදී අම්බලන්ගොඩ ගා/ ධර්මාශෝක විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීම “ මැයෙන් දෙමාපියන් 24 දෙනෙකුගේ අත්සනින් යුතුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

නිත්‍යානුකූලව හා පාරම්පරිකව අම්බලන්ගොඩ නගරයේ පදිංචිව සිටින අපහට ආසන්නම පාසල වන ධර්මාශෝක විද්‍යාලයට දරුවා ඇතුලත් කර ගැනීමට නොහැකි වී ඇත්තේ චක්‍රලේඛනයේ සඳහන් යම් කොන්දේසි නිසා බවත් අප පදිංචිව සිටින්නේ පාසලට ඉතාම ආසන්නයේ බවත් එබැවින් විද්‍යාලය ආසන්නයේම පදිංචි ජනතාව වන අප ලකුණු 90 ට වඩා ලබා ඇති බවත් මෙම අසාධාරණයට ලක්වුන දරුවන් ධර්මාශෝක විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙම නම් ලැයිස්තුව බැලුවම පේනව නගරයේ පාසගකට තමන්ගේ දරුවා ඇතුලත් කර ගැනීමට නොහැකි වූ පිරිසක් මෙම ලිපිය ඉදිරිපත් කරල තියෙන්නෙ. සීනුව ඇසෙන දුරින් ඉන්න දරුවන්ට මේ ජාතික පාසල් දෙක සහ කුලරත්න විද්‍යාලය පවා අහිමි වෙලා තියෙනවා. අපි සෑම වසරකම මේ පිළිබඳව පැය ගණන් මේ සභාවෙ සාකච්ජා කරල අධ්‍යාපන අමාත්‍යාංශෙට දන්වා යවල තියෙනවා. අද වෙනතුරු කිසිදු ප්‍රතිචාරයක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිල නැහැ. හරිම කණගාටුදායක තත්වයක් ඒක. මම ඉල්ලා සිටින්නෙ සභාපතිතුමනි මෙම ලිපිය මානව හිමිකම් කොමිසමට කරුණාකරල ඉදිරිපත් කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ඉතා සංවේදී කරුණක්. මමත් මේ ගැන පෞද්ගලිකවම කල්පනා කරා නගර සභාවේ සභාපතිවරයා වශයෙන් පුරවැසියෙක් ලෙස ලිවීමට. මේ කරුණට පිලිතුරක් පාසලට නෑ. පටබැඳිමුල්ලෙ ළමයි 12 ක් 14 ක් විතර ළමයි අහුවෙලා නෑ. ධර්මාශෝක විද්‍යාලය පිහිටල තියෙන්නෙත් පටබැඳිමුල්ල ගමේ. ගමේ ළමයින්ට ගමේ පාසලට ඇතුලත් නේන බැරිනම් හරිම අසාධාරණයි. චක්‍රලේඛනයෙත් විශාල දුර්වලකම් රාශියක් තියෙනවා. ඒ දුර්වලකම් හේතුවෙන් ඇත්තටම මානව හිමිකම් කඩ වෙනවා. රටක මූලික මිනිස් අයිතිවාසිකම් චක්‍රලේඛනයකින් කඩ කරන්න බැහැ. මමත් මේ සම්බන්ධයෙන් කීප දෙනෙකු සමග කතා කරා. ඒ නිසා මේ සුවිශේෂ අවස්ථාවේ මෙම ලිපියත් මන්ත්‍රීවරුන් දක්වන කරුණුත් සලකා බලා කැඳවීමක් හෝ සාක්ෂි විමසීමක් කරන්න කියලා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරල ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දෙන්නයි කියල යැවීම ඉතාම යෝග්‍ය කරුණක් ලෙස මම දකිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

පාසල් වලට ළමුන් ඇතුලත් කර ගැනීමේ චක්‍රලේඛණයේ තියෙන අඩුපාඩු නිසා තමයි මේ ගැටලුවට දෙමව්පියන් මුහුණ දෙන්නෙ. මේ සම්බන්ධව අපි දිගින් දිගටම කතා කරා. ඒ නිසා සභාපතිතුමා කියූ ආකාරයට නගරයේ දරුවන් වෙනුවෙන් අපි මානව හිමිකම් කොමිෂම වෙත යෑමට සූදානම්. අපේ මන්ත්‍රීවරුන්ගෙ අදහස් යොමු කරල ඒ සම්බන්ධව කටයුතු කරන්න කියල ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ප්‍රශ්නය සම්බන්ධව කොතෙක් කතා කරත් තාම වගකිව යුතු අයගේ අවධානය යොමු වෙලා නැහැ. මෙහිදී සභාපතිතුමනි වගකිවයුතු ස්ථාන වලට පත් වෙන අයගෙ ඩැඩි අවධානය යොමු විය යුතුයි මේ සම්බන්ධව. අපි අදාල පාසල්වල පරිපාලනයට ඇඟිලි ගැසීමක් සිදු කරන්නෙ නෑ. පසුගිය වර්ෂයේ එවන් අත්දැකීමකට අපි මුහුණ දුන්නා. දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා හමුවීමට ගොස් පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් සාකච්ජා කරා. ඊට පසු සභා

වාරයට නිර්නාමිකව ලිපි ඉදිරිපත් කිරීම තුලදී එදා අපි මිත්‍රශීලීව සාකච්ඡා කිරීමත් එතුමන්ලා විවේචනය කරා. අපි මේ පෙනී සිටින්නේ නගරයේ අසාධාරණයට ලක් වූ දරුවන් වෙනුවෙන්. හරි දෙයක් කරන්න බයක් වෙන්න ඕනෙ නැහැයි කියන එකයි මමනම් පිලිගන්නෙ සභාපතිතුමනි. මේ සඳහා පිලියම් යෙදීම ප්‍රාදේශීය දේශපාලනයේ නියුතු අපෙත් වගකීමක්. විකල්ප පාසලක් මේ අම්බලන්ගොඩ කේන්ද්‍ර කරගෙන ස්ථාපිත විය යුතුයි. අපි මේ ප්‍රශ්න වලට පිළිතුරු සෙවිය යුතුයි. දෙමව්පියන්ගෙත් යම් වගකීමක් තියෙනවා. නැවත වතාවක් කියන්නෙ සභාපතිතුමනි මෙයට විකල්ප යෝජනා තියෙනවා. අපි සියලු දෙනා යාන්ත්‍රණයක් ලෙස එකමුතුව කටයුතු කරන්න පුලුවන් නම් මේ අභියෝගය ජය ගන්න පුලුවන් බව මට විශ්වාසයක් තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි සෑම වසරකම මේ ගැන කතා කරා. පසුගිය අවුරුද්දෙ සීලීඩා ආයතනයේ තිබුන වැඩමුලුවෙදි අපි යෝජනා ඉදිරිපත් කරා. නමුත් මේ වන තුරු ඒ කිසිම යෝජනාවකට පිලිතුරු නැහැ. අපි දන්නවා අම්බලන්ගොඩ නගරය කේන්ද්‍රකරගෙන නෙමෙයි මේ චක්‍රලේඛය හැදිල තියෙන්නෙ. මේ චක්‍රලේඛය තුල වැඩිම අසාධාරණයට ලක්වෙලා තියෙන්නෙ අම්බල්නගොඩ අය. විශාල ඉඩ ප්‍රමාණයක් මුහුදින් වෙන්වෙලා තියෙන නගරයක්. ඒවගේම එකම ඉඩමක පවුල් තුන හතර ජීවත් වන නගරයක්. විශේෂයෙන්ම මුහුදුකරය ගත්තහම ඒවගේම හිරේවත්ත , කන්ද මේ හැම ප්‍රදේශයකම ඔප්පුවේ ප්‍රශ්නය ඇවිල්ල තියෙනවා. ඔප්පුවට ලකුණු 6 ක් ලැබෙනකොට ආසන්න පාසලකට ලකුණු 5 ක් කැපෙනකොට මේ ළමයින්ට ධර්මාශෝකය කියන්නෙ සිහිනයක්. අපි දේශාපලන අධිකාරිය වශයෙන් යම් තීරණ ගත්තත් ඒවට පිලිතුරු නැති අවධියක මෙවර මේ ප්‍රශ්නය ඉතාම උග්‍ර වෙලා තියෙනවා. ලබන වසරේදිවත් මේ කරුණු අවම කර ගැනීම සඳහා සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා කියූ ආකාරයට අපි නගර සභාව මුල් වෙලා මේ ලිපිය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරල මේ ප්‍රශ්නය අරගෙන යන්න පුලුවන් නම් අපට ලබන වසරේදිවත් මේ සඳහා පිලිතුරක් ලබා ගන්න හැකිවේවි යැයි සිතනවා.

- ප. ව. 12.15 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා සභා ගර්භයෙන් පිටව ගිය අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මුලාසනයේ අසුන් ගන්නා ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඒවගේම සභාපතිතුමනි ඔය ලිපියෙ සඳහන් වෙලා තිබුණ හොරට ලියකියවිලි හදාගෙන ළමුන් ඇතුලත් කරන පිරිස නිසා තමයි මේ ගැටලුව තවත් උග්‍ර වෙලා තියෙන්නෙ කියලා. ඇත්ත වශයෙන්ම ඔව්. ළමය ඉපදෙන්න ඉස්සෙල්ලම ධර්මාශෝකෙ අවට තැනකට බදු ඔප්පුවක් හදා ගන්නවා. ග්‍රාම සේවක මහතා දෙන සහතිකය මේ දරුවා ධර්මාශෝකයට ඇතුලත් කිරීමට පිටුවහලක් වෙනවා. ඒ සඳහා දේශපාලන නියෝජිතයන් වශයෙන් අපිද වගකිව යුතු වෙනවා. ජන්ද නාම ලේඛන හදද්දි අපිත් සොයා බලනව නම් මොවුන් ඇත්ත වශයෙන්ම පදිංචි කරුවන්ද එහෙම නැත්තම් ධර්මාශෝකෙට ළමයි දාගන්න පදිංචි වුන අයද කියලා. අපි මේ සියලු කරුණු කාරණා එකතු කරල අම්බලන්ගොඩ නගර සභාව මූලිකත්වය ගෙන මේ සඳහා කටයුතු කල යුතුයි. ධර්මාශෝක විද්‍යාලයේ ලේකම් වශයෙන් වසර ගණනාවක් හිටිය සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමාට මේ සම්බන්ධව ලොකු දැනීමක් තියෙනවා. මම මේ වසරේ සම ලේකම් වශයෙන් ඉන්නවා. අභියාචනා මණ්ඩලයේ හිටියා. අපිට ලොකු දෙයක් මෙතනදි කරන්න පුලුවන්. ලබන වසරේදිවත් මේ ගැටලුව මේ අසාධාරණය සිදු නොවෙන්නට කටයුතු කරමුයි කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේක ලබන වසරෙ තමයි කරන්න පුලුවන් වෙන්නෙ. මේ පිරිස ඉතාම සුලු කාරණා අනුව අසාධාරණයට ලක්වුන අය. මේ පිරිසට චක්‍රලේඛණය අනුව කම්ටුව හරියි කියන එක අපට පිලිගන්න වෙනවා. මම කියන්නෙ මේ 40 සීමාව 50 දක්වා වැඩි කරනව නම් 2014 වසර තුල ඒකට මේ පිරසගෙන් කෙනෙක් ගන්න කියන දේ වෙනුවෙන් අපට පෙනී සිටින්න පුලුවන්. මේ සම්බන්ධව අමාත්‍යාංශය දැනුවත් කරනව නම් මේ වසර තුල මේ අසාධාරණය ලක්වෙච්ච ළමයි

පිලිබඳව සලකා බලන්න නගර සභාව පෙනී සිටිමුයි කියන යෝජනාව තමයි මම කියන්නෙ. මගේ කතාවට ඌණපූරණයක් ලෙස සම්බන්ධ කරන්නෙ.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මන්ත්‍රීවරුන් ප්‍රකාශ කල ආකාරයට අම්බලන්ගොඩ නගරයේ දරුවන් වෙනුවෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනවා. එනිසා මෙම වතාවෙ මෙම ඉදිරිපත් කරපු ලිපිය අනුව මන්ත්‍රීවරුන් සියලු දෙනාගෙ අදහස් අරගෙන මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙමුයි කියන තීන්දුව අපි ගන්නවා.

**තීරණය**

☛ **මේ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කර ගැනීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කිරීමට සභාව තීරණය ලදී.**

12.15 " ස්තුතිය පුද කිරීම සම්බන්ධවයි " මැයෙන් ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මාගේ මෑණියන් වූ ගර්ලින් ගුණවතී ද සිල්වා ජසෙන්තුලියන මහත්මිය පරලෝසැපත් වූ අවස්ථාවේ සිට අවසන් කටයුතු සිදු කරන අවස්ථාව දක්වා නන් අයුරින් සහයෝගය දැක්වූ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මැතිතුමාටත්, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ඇතුලු පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ටත්, මන්ත්‍රීතුමියටත්, අම්බලන්ගොඩ නගර සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ පියා ඇතුලු පවුලේ සැම වෙනුවෙන් ස්තුතිය පුද කරන බව දන්වා තිබුණි.

**තීරණය**

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි නොවැම්බර් මාසයේදී මහ අම්බලන්ගොඩ බස් රථය පිළිබඳව විමසීමක් කරා. එහි ප්‍රගමනය කොහොමම කියල දැනගන්න කැමතියි. මම ඉල්ලා සිටිනවා දින දෙක තුනකට වරක්වත් මේ ගැන දුරකථන ඇමතුමක් දීල සොයන්න කියලා. මොකද මගී ජනතාවට ඒ කෙටි කාලය තිබුණ පහසුකම සහ සුබ සාධන තත්වය පිළිබඳව දරුවන් සහ දෙමාපියන් මෙයින් තිබුන පහසුව ගැන දිගින් දිගටම කියනවා. ඒ බස් රථ රියදුරු විසින් කරන ලද අත්තනෝමතික ක්‍රියාවක් හේතුවෙන් තමයි ඒ දේවල් වුනේ. නැතිනම් මෙය හොඳ සේවාවන් විදියට ක්‍රියාත්මක වුනා. මොකද පාසල් යන වේලාවට සහ ඇරෙන වේලාවට මහ අම්බලන්ගොඩ මංසන්ධියට එන විට කෙනෙකුට ඇතුලු වීමට නොහැකි තරමට ජනතාව බස් රථය තුල සිටියා.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් නැවත වතාවක් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිමා සහ ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කිරීම සිදු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි දැනුවත් කරනවා වගේම දුරකථන ඇතුම් දෙක තුනක් ලබා දීමත් සිදු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒවගේම සභාපතිතුමනි අපි අයිපෑඩ් ඉල්ලීම සිදු කරා. එහි දැනට තිබෙන තත්වයත් දැනගන්න කැමතියි.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

කොමසාරිස්තුමාගෙ අනුමැතියට යවල තියෙනවා. මෙතෙක් සභාවට ලැබිල නැහැ. අනුමැතිය ලැබුන පසු ඉදිරි කටයුතු සිදු කිරීම කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි සමහර පාරවල් තියෙනවා පා පැදියක්වත් යන්න බැරි. විශේෂයෙන්ම ශ්‍රී විජයාරාම පාර, පඤ්ඤාලෝක මාවත, විහාරගොඩ මාවත, බුද්ධදත්ත මාවත, සංඝරාජ මාවත, හින්ඇල හරස් පාර, හීන් ඇල අතුරු මාර්ගය ඒවගේම ධම්මානන්ද මාවත යන පාරවල් ගිහිල්ල බලන්න මේවගේ පා පැදියකින්වත් යන්න බැහැ. කොච්චර සංවර්ධන කටයුතු කරත් ප්‍රධාන පාරවල් වල තත්වෙ මේකනම් ඒක තමයි නරක විදියට පේන්නෙ. අපි ඉස්සර කියනවා අම්බලන්ගොඩ නගරයෙ ඉඳන් කන්දෙගොඩට යනකොට කණෙකුට උනත් තේරෙනව කන්දෙගොඩට වැටුනයි කියල පාරවල් වල තත්වය අනුව. අද කන්දෙගොඩ ඉඳන් අම්බලන්ගොඩට එනකොට පඤ්ඤාලෝක මාවතට ශ්‍රී විජයාරාම පාරට වැටුනයි කියල කණාට වුනත් තේරෙනවා. මේ පාරවල්වල නඩත්තු කිරීම් නොමැති කම ජනතාවට හඳින්ම දැනිල තියෙනවා. ඒ නිසා ඒ නඩත්තු කටයුතු සිදු කරන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔබතුමා කියන දේ සත්‍යක් තියෙනවා. මම නැහැයි කියන්නෙ නෑ. අපේ කර්මාන්ත අංශෙ ඉන්න සේවකයන් එක්ක නඩත්තු කිරීම් කටයුතු කරන්න හරිම අමාරුයි. ඒ නිසා තමයි මම යෝජනා කරේ සෘජු ශ්‍රමික පදනම මත මේ කටයුතු සිදු කරන්න කටයුතු කරමුයි කියල. මේ වනවිටත් මහ අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් පටන් අරගෙන තියෙනවා. මෙම පාරවල් ඇත්තට කල යුතු පාරවල්. මම කම්කරුවන් පිරිසක් එවන්නම් මේ කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි 2006 ඉඳගෙන මේ දක්වා මන්ත්‍රී නාම ලේඛනය ලියන්න බැරිවෙලා තියෙනවා. ඒ නිසා එය සකස් කරන්න.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මමත් දැක්ක ඒ අඩුපාඩුව. ලබන සභාව වෙනකොට එය සකස් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි රණසූරිය පාර අබලන් තත්වයේ තියෙන්නෙ.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එය ඉතාම අබලන් තත්වයේ තියෙන්නේ. ඉතා ඉක්මනින් එය ඉටු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ මාර්ගය ජල සම්පාදන මණ්ඩලයේ කටයුතු නිසා අබලන් වෙලා තියෙන්නෙ. සිරි විජයාරාම විහාරස්ථානය අසල ඉදල මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ලොකු පරාසයක් තුල ලොකු වලවල් තියෙනවා. ඒ දේවල් පිලිසකර කරල පාර යථා තත්වයට ගන්න කියල ඉල්ලා සිටිනවා. ඊට අමතරව ඩල සම්පාදන මණ්ඩලය දැනුවත් කරල අපට අදාල මුදල් ගෙන්වා ගැනිමට අවශ්‍ය කටයුතුත් කරන්න කියල ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අදාල මාර්ගය අලුත්වැඩියා කටයුතු කරන්නත් ජල සම්පාදන මණ්ඩලයට ඒ පිළිබඳව දන්වා යැවීමටත් කටයුතු කරන්න.

- **ප. ව. 12.35 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| භාරත සමරසේකර,<br>ලේකම් ,<br>අම්බලන්ගොඩ නගර සභාව. | ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,<br>සභාපති,<br>අම්බලන්ගොඩ නගර සභාව. |

**2013 – 01 – 29 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**